| Three months | : | Rs. 100.00 |
| One year | : | Rs. 350.00 |
| Life time | : | Rs. 1000.00 |
| Institutional membership (One year) | : | Rs. 2500.00 |

**For further details, please contact** :
Tele : 011 2674386, 011 2685197
Fax : 011 2685201
E-mail : reader@mail.natlib.lk
URL : http://www.natlib.lk

# ඩිවි 22 වන සංස්කරණයේ නව ප්‍රවේශ සහ නව සහශ්‍රයට එහි සාපේක්ෂ වැදගත්කම

ඩබ්. එම්. ඒ. කේ. විජේකෝන්
ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
මිහින්තලේ

## හැඳින්වීම

නව සහශ්‍රය "විඥාපන විප්ලවය" (Information Revolution) "දැනුම් සමාජය" (Knowledge Society) "අතාත්වික පුස්තකාල" (Virtual Libraries) යනාදි බහුවිධ සංසිද්ධි සමාජගතව ඇති අවධියකි. පුස්තකාල දැනුම සංවිධානය විෂය ක්ෂේත්‍රයේ ද වෙනස්කම් රැසකට විෂයගත අවධියකි. පුස්තකාල දැනුම සංවිධාන ක්‍රමවේදයක් ලෙස ඩිවි 22 සංස්කරණය පරිගණක සන්දර්භය තුළ නිර්මිත ප්‍රථම වෙබ් සංයුතිය වශයෙන් සමාජාවතිර්ණව ඇත්තේ ද මෙම පරිසරය තුළය.

උක්ත පසුබිම තුළ ඩිවි දශම වර්ග ක්‍රමයේ නව ප්‍රවේශ සහ නව සහශ්‍රයට එහි සාපේක්ෂ වැදගත්කම අධ්‍යයනය පුස්තකාල දැනුම සංවිධාන ක්‍රම වේදයෙහි ලා කාලෝචිත පියවරක් වනු ඇත.

## ඩිවි දශම වර්ගීකරණය : විකාශනය

1876 දී මෙල්විල් ඩිවි විසින් සම්පාදිත ඩිවි දශම වර්ගීකරණය 2003 වන විට එහි 22 වන සංස්කරණය පළ කිරීමට සමත් විය. 2011 දී එහි 23 වන සංස්කරණය පළ කිරීමට නියමිතය. දැනට ලෝකයේ රටවල් 135 ක් පමණ භාවිත භාෂා 30 කට පමණ පරිවර්තිත මෙය ලොව ජනප්‍රියතම වර්ගීකරණය ලෙස ද සැලකේ.

1876 ඩිවි ප්‍රථම සංස්කරණයේ සිට 2003 දී 22 සංස්කරණය දක්වා ඉතිහාසය තුළ විශ්ව ඥාන පරිණාමයට සමගාමීව ඩිවි වෙනස්වීමට දරූ උත්සාහය මැනවින් කැපී පෙනේ.

පරිගුණිත වර්ග ක්‍රමයක් ලෙස බිහි වූ ඩිවි දශම වර්ගීකරණය තත්කාලීන විෂය අවශ්‍යතා සහ අන්‍ය වර්ගීකරණ ක්‍රමවල බලපෑම මත පරිගුණිත වර්ග රටාවෙන් මිදී මුඛාශ්‍රිත වර්ග රටාවකට පරිණාමය වීම එහි සංස්කරණ ඉතිහාසය තුළ ප්‍රකට ලක්ෂණයකි. මෙම ලක්ෂණය වර්ග ක්‍රමයේ අඛණ්ඩ භාවිතය සහ සජීවී බව තහවුරු කෙරෙන සාධකයක් ලෙස ද සැලකිය හැකිය.

1876 ඩිවි මුලින්ම ප්‍රකාශිත වූයේ වර්ග අංක 1000 කින් යුතු පිටු 44 ක ප්‍රකාශනයක් ලෙසය. 22 සංස්කරණය වන විට එය වෙළුම් 4 කින් යුතු පිටු 4037 ක ප්‍රකාශනයක් බවට පත් වූවා මෙන්ම ඉහළ ගුණාත්මක තත්වයකට ද පත්ව ඇත.

1876 සිට 1952 15 වන සංස්කරණය දක්වා එක් වෙළුමක් වශයෙන් ද, 16 - 17 සංස්කරණ වෙළුම් දෙකක්, 18-19 සංස්කරණ වෙළුම් 3ක්, සහ 20 - 22 සංස්කරණ වෙළුම් 4ක් ලෙසත් ප්‍රකාශයට පත් වූ ඩිවි දශම වර්ගීකරණය සංස්කරණයෙන් සංස්කරණයට වර්ග අංක සහ සංලේඛ වැඩි ප්‍රමාණයක් ඇතුළත් කර ගෙන තිබේ. නව විෂය ශික්ෂණ සහ විෂය යුක්ති හඳුන්වාදීම මගින් විෂය විශ්ලේෂණ සංස්ලේෂණ අවකාශ පුළුල් කර ඉදිරිපත් කිරීමට ගෙන ඇති උත්සාහය ද දැකිය හැකිය.

16 සංස්කරණයෙන් "රූපන බෙදුම් වක්‍රය" ද 17 සංස්කරණයෙන් "ප්‍රමිත උප බෙදුම් සහ භූගෝලීය වක්‍රය" ද හඳුන්වා දෙයි. 18 සංස්කරණයෙන් සහායක වක්‍ර 7 දක්වා වැඩි විය. වක්‍ර වැඩිකර ගැනීම මගින් අංකනයේ ප්‍රසාරණීයතාව, විෂය විශ්ලේෂණය, ස්මෘති සහායකත්වය වැනි ගුණාංග සහ වර්ග ක්‍රමය මුඛාශිත තත්වයට පත් කිරීමට උනන්දු වූ අයුරු දැකිය හැකිය.

18-19 සංස්කරණ මගින් විෂය විශ්ලේෂණය පිළිබඳ වැඩි අවධානයක් යොමු කරමින් වර්ග ක්‍රමයේ වෙනස්කම් සිදු කර තිබේ. 19 සංස්කරණයෙන් 340,510,301,324 වැනි දුර්වල වර්ග පංති සම්පූර්ණයෙන් වෙනස්කර **"ෆිනික්ස් අනුසූචි"** හඳුන්වා දීම නව ප්‍රවණතාවකි.

1989 "20 සංස්කරණය" බිහිවීම ඩිවි මුඛාශිත වර්ග ක්‍රමයකට ප්‍රවේශ වීමේ ප්‍රවණතා ගණනාවක් පෙන්නුම් කරයි. 20 වන සංස්කරණය කාණ්ඩ 4 කින් ප්‍රකාශයට පත් කිරීම, නව හැඳින්වීමක් යෙදීම, සංශෝධිත උපලේඛන භාවිතය, 01 සහ 03 සහායක වක්‍ර ප්‍රමාණවත් ලෙස සංශෝධනය කිරීම, සාපේක්ෂ අනුක්‍රමණිකාව සංවිධිත කිරීම වැනි වෙනස්කම් ඒ අතර වේ.

1996 "ඩිවි 21 සංස්කරණය" 21 සියවසට සාපේක්ෂව නව ප්‍රවණතා රැසකින් පෝෂණය කිරීමට ප්‍රකාශකයින් උනන්දු වූ බව පෙන්නුම් කෙරේ. ඒ අනුව ඩිවි 21 "මුද්‍රිත" සහ "විද්‍යුත්" යනුවෙන් මාධ්‍ය දෙකකින් ඉදිරිපත් විය. මාර්ගගත ප්‍රවේශය සඳහා වූ ප්‍රථම සංස්කරණය ලෙස බිහිවන මෙහි උපයෝජක මිත්‍රශීලි භාවිතය, ජාත්‍යන්තර භාවිතය, මූලික අරමුණු විය.

351 මහජන පරිපාලනය, 560 - 590 ජීව විද්‍යා වර්ග පංති සංශෝධිත වර්ග පන්ති ලෙස යාවත්කාලීන වූ අතර 297 ඉස්ලාම් ආගම, 368 රක්ෂණය, 370 අධ්‍යාපනය වර්ග පංති කැපී පෙනෙන ප්‍රති සංශෝධනයට ලක්වන අයුරු දැකිය හැකිය.

**ඩිවි 22 සංස්කරණය**

දැනුම සංවිධානයේ ගතිකත්වයට සාපේක්ෂව මෙම සංස්කරණය 2003 වර්ෂයේ දී වෙළුම් හතරකින් සමන්විත විය.

**පළමු වෙළුම**

ඩිවි 22 සංස්කරණයේ නව ලක්ෂණ, හැඳින්වීම, පාරිභාෂිත ශබ්දමාලාව, පාරිභාෂිත ශබ්දමාලාව සඳහා අනුක්‍රමණිකාව, අත්පොත, සහායක වක්‍ර, 21-22 සංස්කරණවල සංසන්දනාත්මක ලැයිස්තු මීට අයත් ය.

**දෙවන වෙළුම**

මූලික විෂය සාරාංශ

000 – 599 දක්වා ප්‍රධාන වර්ග පංති අනුසූචි

**තුන්වන වෙළුම**

600 – 999 දක්වා ප්‍රධාන වර්ග පංති අනුසූචි

**හතරවන වෙළුම**

සාපේක්ෂ අනුක්‍රමණිකාව

**නව ප්‍රවේශ සහ ප්‍රවණතා**

වෙබ් පරිසර සන්දර්භය තුළ (Web Environment) සමාජරෝපිත ප්‍රථම වෙබ් සංස්කරණය ලෙස ඩිවි 22 බිහිවීම, එහි තවත් නව ප්‍රවේශයකි. වෙබ් සාධකය නිසා ඩිවි අඛණ්ඩව යාවත්කාලීන කිරීම සහ යාවත්කාලීනතා, උපයෝජකයාට පහසුවෙන් ලබාදීම පහසු වී ඇති තොරතුරු මූලාශ්‍ර සඳහා ප්‍රවේශය ව්‍යාප්තියටත් ජාත්‍යන්තර පාඨක පදනම සමඟ කාලීන සහයෝගිතාවය සංවර්ධනයටත්, මින් අවකාශ සැලසී ඇත. එසේම වර්ගීකරණයේ නිරවද්‍යතාව සහ කාර්යක්ෂමතාව වර්ධනයට එය සාධනීයව බලපා ඇත.

1996 ඩිවි 21 මගින් මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය (In print & Electronic Form) පිටපත් ලෙස ද්විත්ව සංයුතිගතව ඉදිරිපත් වූ ඩිවි වර්ග ක්‍රමයේ අඛණ්ඩ යාවත්කාලීන ප්‍රතිපත්තිය ඩිවි 22 සංස්කරණයෙන් වඩාත් ප්‍රදර්ශිත වූ ආකාරය ද දැකිය හැකිය.

ජාත්‍යන්තර සහයෝගිතාවය මත ඩීවී වර්ග ක්‍රමය සජීවිකරණය ද එහි නව ප්‍රවණතාවක් ලෙස අගය කළ හැකිය. මේ අනුව ඩීවී දශම වර්ගීකරණ ප්‍රතිපත්ති කමිටුවේ සහ ඩීවී පරිවර්තන කොටස්කරුවන්ගේ උපදේශකත්වය මත ඩීවී 22 හි වචනාවලිය සංවර්ධිතව ඇත. එසේම භූගෝලීය ප්‍රදේශ, නීතිය, දේශපාලන පක්ෂ, භාෂාව, සාහිත්‍ය, ඓතිහාසික යුග ආදිය යාවත්කාලීනව සංවර්ධනය කර තිබීම සාධනීය ලක්ෂණයකි.

වර්ගීකාරකයාගේ කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය ඩීවී 22 හි නව අභිප්‍රායකි. ඒ අනුව සංලේඛ ක්ෂණිකව අවබෝධයට සහ කාර්යක්ෂම භාවිතයේ යෙදවීමට හැකි පරිදි අත්පොත සංවිධිත කර ඇත. එසේම පුද්ගල කණ්ඩායම් (7 සහායක චක්‍රය) චක්‍රය ඉවත් කරනු ලැබ ඇත.

සංකීර්ණ විෂය සංකල්ප ආවරණයේ දී පරිගුණිත වර්ග ක්‍රමයක් ලෙස ඩීවී ක්‍රමයට ආවේණික සීමා සහ දුර්වලතා ඉවත් කිරීම ඩීවී 22 මගින් ගෙන ඇති ප්‍රයත්න එහි වර්ධනීය අදියරයකි. ඒ අනුව මුඛාශ්‍රිත වර්ග ක්‍රමවලට ආවේණික විෂය විශ්ලේෂණීය සංස්ලේෂණීය ගුණාංග ශුද්ධ අංකන පරාසය තුළ පවත්වා ගෙන යාමට ඩීවී ගෙන ඇති ප්‍රයත්නය අගය කළ හැකිය.

මේ අනුව නව සහශ්‍රයට සාපේක්ෂව වර්ගීකරණයේ ප්‍රමාණාත්මක සහ ගුණාත්මක සංවර්ධනයක් තුළින්, එහි අඛණ්ඩ පැවැත්ම හා සජීවී බව තහවුරු කර ගැනීමට ඩීවී 22 සංස්කරණයෙන් ගෙන ඇති ධනාත්මක පියවර කිහිපයකි.

1. සංශෝධිත වර්ග පංති (Revised Classes)
2. සමාන්තර අනුසූචි (Parallel Schedules)
3. විශේෂ උප බෙදුම් (Special Subdivisions)
4. සහායක චක්‍ර (Tables)
5. යුක්ති භාවිතය (Devices)
6. විෂයාන්තර සබඳතා විශ්ලේෂණය (Inter Subject Relation)
7. අන්තර් විෂය මුඛ සම්බන්ධතා විශ්ලේෂණය (Inter facet Relation)
8. සාපේක්ෂ අනුක්‍රමණිකාව (Relative Index)
9. අත්පොත (Hand book)

**සංශෝධිත වර්ග පංති (Revised Classes)**

ඩීවී 21 සංස්කරණයේ නව ප්‍රවේශයක් වූ මෙය, ඩීවී 22 සංස්කරණයේ දී වඩාත් සංවර්ධිතය. මේ අනුව "004-006" පරිගණක විද්‍යාව (Data processing - Computer Science) ඩීවී 21 සංස්කරණයේ 652.5 යටතේ පරිගණක විද්‍යාවෙන් දුරස්ථව ස්ථානගත කර තිබූ "වදන් සැකසුම" (Word Processing) විෂය 22 සංස්කරණයෙන් 005.52 යටතේ පරිගණක විද්‍යා අනු විෂයයක් ලෙස ස්ථානගත කර ඇත. මෙය සමාන විෂය එක්තැන් කර දැක්වීමේ වර්ගීකරණ මූලධර්මය සුරැකීමක් මෙන්ම, වර්ග ක්‍රමය සංවිධිත කිරීමේ පියවරක් ලෙස ද වැදගත්ය.

නව සහශ්‍රයට සාපේක්ෂව නව විෂය ශික්ෂණ සඳහා අනු සූචියේ ඉඩ සලසා දීම ද, ප්‍රතිශෝධිත වර්ග පංති තුළ ප්‍රකට ලක්ෂණයකි. පහත දැක්වෙන විෂය අංක මගින් නියෝජිත නව විෂය ශික්ෂණ, මෙයට පැහැදිලි නිදසුන් සපයයි.

| | | |
|---|---|---|
| 005.722 | - | Character sets |
| 070.57973 | - | Web publication |
| 302.231 | - | Digital Media |
| 650.11 | - | Time Management |
| 658.0412 | - | Home Based Business |

බටහිර පක්ෂපාතීත්වය අවම කිරීමට, ඩීවී 21 මගින් ආගම වර්ග පංතියට අදාළව හඳුන්වා දුන්, සංස්කරණ සැලසුම් මත 22 සංස්කරණයේ ආගම වර්ග පංතියේ වෙනස්කම් රැසක් කරනු ලැබ ඇත. මේ අනුව ඩීවී 21 හි 291 යටතේ තිබූ ආගමේ විශේෂිත අංශ මෙහි 201, 209 අංක යටතේ සංශෝධනය සහ ව්‍යාප්ත කරනු ලැබ ඇත. ඩීවී වර්ග ක්‍රමය බටහිරට පක්ෂවීම අවම කිරීමට, ඩීවී සංස්කරණ කමිටුව දරන උත්සාහයේ ගාමක පියවරක් ලෙස අගය කළ හැකිය.

305 - සමාජ කණ්ඩායම්
306 - සංස්කෘතිය වර්ග පංති සංශෝධිත වර්ග පංති අතර වේ.

අන්තර් රාජ්‍ය සංවිධාන, මානව හා ජාතීන් සඳහා නීති, විෂය ශික්ෂණ, සඳහා 340 වර්ග පංතියේ නව ප්‍රවණතා රැසක් සිදු කර ඇත. 341 ජාත්‍යන්තර නීතිය (International law) ජාතීන්ගේ නීතිය (Law Of Nations) ලෙස වාග් තලයෙන් පෝෂණය කර ඇත.

510 ගණිත වර්ග පංතිය ද හරවත්ව යාවත්කාලීන කරනු ලැබ ඇත. ඒ අනුව

| | | |
|---|---|---|
| 512.6 | - | Category Theory, Homological Algebra, k-theory |
| 512.78 | - | Specific Fields Numbers |
| 515.39 | - | Dynamical Systems |
| 518 | - | Numerical Analysis |

යනුවෙන් නව විෂය අංක හඳුන්වා දීම, ව්‍යාප්ත කිරීම, ප්‍රතිස්ථාපනය කරනු ලැබ ඇත.

610 "වෛද්‍ය විද්‍යාව සහ සෞඛ්‍ය" යාවත්කාලීන වර්ග පංති අතර විශේෂ වේ. වෛද්‍ය විද්‍යාව විෂය මාතෘකා වැඩි දියුණු කර තිබීම මෙහි දී කැපී පෙනෙන ලක්ෂණයකි.

ඩිවි 21 හි 647.94 "සංචාරකයන්ට පහසුකම් සැළසීම" විෂය ඩිවි 22 හි 910.46 යටතේ අර්ථාන්විතව ස්ථාන ගත කර ඇත.

930-999 ඉතිහාසය වර්ග පංතිය තුළ යුග බෙදුම් ක්‍රමවත්ව යාවත්කාලීන කිරීමට ගත් උත්සාහය දැකගත හැකිය.

මේ අනුව ඩිවි 22 මගින් සංශෝධිත වර්ග පංති ආශ්‍රිතව නව වෙනස්කම් රැසක් කර ඇති බව පැහැදිලි ය. එසේම සමාන විෂය වෙනස් කිරීමට නව ක්‍රමවේද ඉදිරිපත් කර ඇත. මෙමගින් වර්ග ක්‍රමයේ සහාය අනුක්‍රමය ආරක්ෂණයත්, කාලීන විෂය අවශ්‍යතා නියෝජනය වීමත් අනුව නව සහශ්‍රයට එහි ඇති වැදගත්කම තහවුරු වේ.

සහායක වගු (Tabels)

ඩිවි 21 හි 7 ක් වූ සහායක වගු 6 දක්වා අඩු කර තිබීම ඩිවි 22 හි නව ප්‍රවේශයකි. මේ අනුව ඩිවි 22 හි සහායක වගු පහත සඳහන් ලෙස දක්වා ඇත.

| | | |
|---|---|---|
| T1 | - | ප්‍රමිත උප බෙදුම් |
| T2 | - | භූගෝලීය ප්‍රදේශ, ඓතිහාසික යුග, පුද්ගලයන් |
| T3 | - | විශේෂ සාහිත්‍ය රූපන සඳහා උප බෙදුම් |
| T3 A | - | ඒක කර්තෘ හෝ ඒක කර්තෘන් පිළිබඳ කෘති |
| T3 B | - | බහු කර්තෘක කෘති හෝ බහු කර්තෘන් පිළිබඳ කෘති |
| T3 C | - | 3B වගුයෙහි 700.4- 791.4 සහ 808 -809 දක්වා උපදෙස් පරිදි කළ හැකි එකතු කිරීම |
| T4 | - | විශේෂිත භාෂා සහ භාෂා පවුල් හි උප බෙදුම් |
| T5 | - | ගෝත්‍රික හා ජාතික උප බෙදුම් |
| T6 | - | භාෂා උප බෙදුම් |

ඩිවි 22 හි සහායක වගු භාවිතයේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක වෙනස්කම් රාශියක් සිදුකර තිබේ.

මේ අනුව ප්‍රමිත උප බෙදුම් සෑම විටම මුලට තනි බිංදුවකින් නියෝජනය වුවද, අනුසූචියේ එකතු කිරීමක දී "0", "00" "000", වශයෙන් සංයෝජනයට උපදෙස් දි ඇත.

නිද :- 300.1
300.01
300.001

මෙය විෂය ව්‍යාප්තියට අනුගතව ප්‍රසාරණීයතාවයෙන් යුත් වර්ගාංක ගොඩනගා ගැනීමට සහායක වගු භාවිතය පිළිබඳ ඉදිරි ප්‍රවේශයකි. මෙහිදී "0" විෂයක ස්වරූපීය ලක්ෂණ නියෝජනයට ප්‍රතිපක්ෂව, විෂය ව්‍යාප්තිය නියෝජනය කිරීමේ සංකේතයක් ලෙසද වැදගත් වේ.

නිද :- රෙදිපිළි කර්මාන්තය පිළිබඳ ශබ්දකෝෂය 677.0039143

**භූගෝලීය සහායක චක්‍රය (02 චක්‍රය)**

තත්කාලීන සමාජ, ආර්ථික, දේශපාලන, සංසිද්ධි හා අනුගතව භූගෝලීය වෙනස්කම් නියෝජනයට සංශෝධන, රැසක් මෙහි සිදුකර ඇත.

නිදසුන්
- 29 Persons Treatment of Non-humans
- 7971 Eastern Washington
- 7976 West Washington (නව අංක)
- 414 Scotland
- 541 - 548 India
- 5492 Bangladesh

(ප්‍රතිශෝධිත හා විස්තාරිත අංක)

විෂයක "0"භූගෝලීය කලාප පූර්ණ වශයෙන් විශ්ලේෂණය මෙහි වැදගත් ලක්ෂණයකි. මේ අනුව සංයෝජක සංකේත ලෙස ගෙන භූගෝලීය කලාප එකකට වැඩි ගණනක් එකතු කර දැක්විය හැකි වේ.

නිද :- බ්‍රසීලය සහ අරාබි ලෝකය අතර ජාත්‍යන්තර සම්බන්ධතා - 327.810174927

**විශේෂ සාහිත්‍ය රූපන උප බෙදුම් (03 චක්‍රය)**

නව සහශ්‍රයේ සාහිත්‍ය විෂයේ ප්‍රවර්ධන හා වෙනස්කම්වලට සාපේක්ෂව වර්ගාංක ගොඩනගා ගැනීමට හැකි පරිදි නව අංක, නව ස්ථාපන, සංශෝධන, විස්තාරණ රැසක් මෙහි සිදුකර ඇත.

නිද :- 30877 – picaresque fiction (නව අංකයකි)

සාහිත්‍ය විෂයේ විෂය මුඛ විශ්ලේෂණය කර මුඛාශ්‍රිත ලක්ෂණ වලින් සුසංගත වර්ග අංක ගොඩ නගා ගැනීමට මෙම චක්‍රයෙන් අවකාශ සළසා ඇත.

හින්දු පද්‍යවලින් නිරූපිත බෙංගාලය - 891.43109325414

891.43 හින්දු සාහිත්‍ය (අනුසූචිය)
- 1 පද්‍ය (සහායක T3)
- 09 විචාර (අනුසූචිය T3)
- 32 ස්ථාන (අනුසූචිය T3 A)
- 5414 බෙංගාලය

(අනුසූචිය T5-T3 හි 32 ස්ථාන යටතේ උපදෙස් දී ඇති පරිදි)

උක්ත වර්ග අංකයේ විෂය, ස්වරූපය, අනු ස්වරූපය, ස්ථානය යනාදිය දැක්වෙන විෂය මුඛ වලින් ඩිවි 22 විෂය විශ්ලේෂණයෙහිලා දක්වන ප්‍රවණතාවත් හඳුනා ගත හැකිය.

**භාෂා උපබෙදුම් චක්‍රය (4 චක්‍රය)**

විශේෂිත ශබ්ද කෝෂ - 31
ව්‍යාකරණ - 5

යනාදි භාෂා උප බෙදුම් කාලීන විෂය අවශ්‍යතා අනුව විස්තාරණය කරනු ලැබ ඇත.

අක්ෂර වින්‍යාසය හා උච්චාරණය - 813
බිහිරි පුද්ගල වාචික භාෂා සහ භාෂා භාවිතය - 89

නව අංක සහ උප බෙදුම් ලෙස හඳුන්වා දී ඇත.

**ජන වාර්ගික සහ ජාතික කණ්ඩායම් (5 චක්‍රය)**

21 සංස්කරණයේ "වාර්ගික, ගෝත්‍රික හා ජාතික කණ්ඩායම්" ලෙස හැඳින්වෙන 5 චක්‍රය ඩිවි 22 හි "ගෝත්‍රික හා ජාතික කණ්ඩායම්" ලෙස වෙනස් කර ඇත . "Racial" ඉවත් කිරීම නව ලෝකය අනුව යමින් ජන වර්ග පිළිබඳ පවත්නා උස් පහත්කම් අවධාරණය අහෝසි කිරීමකි.

**භාෂා චක්‍රය (6 චක්‍රය)**

මෙයද නව සංශෝධනවලින් පරිපූර්ණ වූවකි. උතුරු ජර්මන්, ස්විස්, නෝර්වේජියන්, උතුරු හා දකුණු ඇමරිකානු ස්වදේශීය භාෂා විස්තාරණය සහ නැවත වෙනස් කර අංක ලබා දී තිබේ.

**පුද්ගල චක්‍රය (7 චක්‍රය)**

මෙය 22 සංස්කරණයෙන් ඉවත් කිරීම නවතාවයකි. අන්තර්ගත උප බෙදුම් විෂය අංක අනුසුචියෙන් හා චක්‍රවලින් ලබා ගැනීමට අවකාශ සැලසීමෙන් වර්ගීකරණය සුමට කිරීමට ගෙන ඇති උත්සාහය පෙනේ.

**යුක්ති භාවිතය - Devices**

මෙය කාලීන විෂය විශ්ලේෂණීය අවශ්‍යතා මත විෂයාංග, විශ්ලේෂණය සහ සංස්ලේෂණයට ඩීවී 22 න් ලබා දී ඇති අවකාශය මැනවින් ප්‍රදර්ශිත ප්‍රවණතාවකි. මේ අනුව හිදැස්, අකාරාදි, දශම, විෂය යනාදි විවිධ යුක්ති භාවිතය දක්නට ඇත.

**විෂය යුක්තිය - Subject Device**

විෂයක් නව විෂයක අනු විෂයක් ලෙස විශ්ලේෂණයේදී, "000 - 999" දක්වා එකතු කරන්න යන උපදේශනය යටතේ ඩීවී 22 හි මෙම යුක්තිය මැනවින් භාවිත වේ. මේ මගින් මූලික අංකයට වර්ග ක්‍රමයේ වෙනත් ඕනෑම ස්ථානයකින් අංක එකතු කර විෂය විශ්ලේෂිත වර්ගාංකයක් ගොඩ නගා ගැනීමේ අවස්ථාව උදාකර ඇත.

නිද :- පුස්තකාල වෘත්තියේ රැකියා ඇබෑර්තු

331.124102

331.1241 පාදක අංකයට 000 - 999 දක්වා එකතු කරන්න.

ගුරුවරුන් සඳහා රැකියා ඇබෑර්තු

331.12313711

331.1231 පාදක අංකයට 000 - 999 දක්වා එකතු කරන්න

**අන්තර් විෂය මුඛ සම්බන්ධතා විශ්ලේෂණය (Inter Facet Relation)**

වත්මන් තොරතුරු නිෂ්පාදනය තුළ අන්තර් විෂය මුඛ සබඳතා සහිත වීම, සංකීර්ණ වර්ගීකරණ ගැටලුවකි. මේ අනුව භූගෝලීය ලක්ෂණ, ඓතිහාසික යුග, ජාතිකත්වය, භාෂාව, යනාදි විෂය මුඛ විශ්ලේෂණය හා ප්‍රති සංස්ලේෂණය කර සුසංගත වර්ග අංක ගොඩනැගීමට ඩීවී 22 න් සළසා ඇති අවකාශ නව සහශ්‍රයෙහිලා ගුණාත්මක ප්‍රවේශයකි.

නිද :- එක්සත් රාජධානිය සහ ප්‍රංශය අතර ආර්ථික සම්බන්ධතා -331.124102 (0, සංයෝජක සංකේතය සේ යොදාගෙන ඇත.)

**විෂයාන්තර සබඳතා විශ්ලේෂණය (Inter Subject Relation)**

තත්කාලීන විෂය බිහිවීම තුළ විෂය අතර සබඳතා පැවතීම ප්‍රකට ලක්ෂණයකි. විෂයාන්තර සබඳතා විශ්ලේෂණයට ඩීවී පූර්ව සංස්කරණය මගින් ගෙන තිබූ ප්‍රවේශ ඩීවී 22 මගින් සංවර්ධනය කිරීම නව සහශ්‍රයෙහිලා එහි සාපේක්ෂ වැදගත්කම තහවුරු කෙරෙන්නකි.

නිද :- ගුරුවරුන් සඳහා පරිගණක විද්‍යාව

004.0243711

දේශපාලකයන් සඳහා ආචාර ධර්ම (සංයෝජක සංකේත සේ යොදාගෙන ඇත.)

170.2432

**අත්පොත - (Hand Book)**

21 සංස්කරණයේ 4 වෙළුමට අදාළ වූ මෙය 22 සංස්කරණයේ පළමු වෙළුමට අදාළව ඉදිරිපත් කිරීම නව ප්‍රවේශයකි. වර්ගීකරණය සඳහා ඩීවී ආදේශනයේ දී පැන නැගෙන ගැටලු සඳහා සවිස්තරව තොරතුරු සැපයෙන සරල මාර්ගෝපදේශකයක් ලෙස මෙය ඉදිරිපත් කර ඇත. මෙහි සංකල්ප සටහන් කුඩා අංශවලට බෙදා චක්‍ර සහ අනුසුචිවල අංක අනුපිළිවෙළින් වින්‍යාස ගත කර තිබීම කියවීමේ පහසුව සංක්ෂිප්ත බව සුරකීමට හේතු වී ඇත.

වර්ගීකරණයට මග පෙන්වීම, ඥාති විෂය සබඳතා ඇති අංක අතර අවශ්‍ය අංක තෝරා ගැනීමට උපදෙස් දීම, වර්ගාංක දෙකක් සමානාර්ථ දක්වන විට ඒ අතර සංසන්දනය දැක්වීමට මෙය වැදගත් වේ. මේ අනුව වර්ගීකරණයේ කාර්යක්ෂමතාවය සහ පහසුව සැළසීමට අත් පොතින් ලැබෙන සුවිශේෂී සහය නව සහශ්‍රයෙහිලා සාපේක්ෂිතව වැදගත් වේ.

### සාපේක්ෂ අනුක්‍රමණිකාව (Relative Index)

ඩිවි 22 වන සංස්කරණය මගින් පූර්ව සංස්කරණ හා සමගතව වැඩි සංලේඛ ප්‍රමාණයක් ඉදිරිපත් කර තිබීම ප්‍රවර්ධනයකි. ජාත්‍යන්තර භාවිතයට උචිත සංලේඛ පද අත්පොත් සටහන් සඳහා අනුක්‍රමණිකා පද, නව අංක, සංලේඛ සහ අතිරේක පද රාශියක් සාපේක්ෂ අනුක්‍රමණිකාවට ඇතුළත් කර තිබේ. මින් විෂයක ඕනෑම ශීර්ෂණයක් එක් ශීර්ෂයක් යටතට ගෙන විෂයක විවිධ දෘෂ්ටි කෝණ අනුව අර්ථ විග්‍රහ කරමින් අංක ගොඩ නගා ගැනීමට පහසුව සැලසී ඇත.

මේ අනුව නව සහශ්‍රයේ ග්‍රන්ථ වර්ගීකරණයට සාපේක්ෂ අනුක්‍රමණිකාව ප්‍රබල මූලාශ්‍රයක් බව සනාථ වේ.

### සමාලෝචනය

ඩිවි දශම වර්ගීකරණය සහ ඩිවි 22 සංස්කරණයට අදාළ උක්ත තොරතුරු සංයුක්තාර්ථයෙන් ගත්විට ගම්‍ය වනුයේ, විශ්ව දැනුම ප්‍රසාරණය, දැනුම සංවිධානය සහ තාක්ෂණික ප්‍රවර්ධනයට සමගාමීව ඩිවි වර්ග ක්‍රමයේ වෙනස්කම් සිදු වෙමින් පවත්නා බවයි. එසේම ප්‍රායෝගික වර්ග ක්‍රමයක් ලෙස පරිණාමයට ඩිවි ක්‍රමයට ඇති ශක්‍යතාව එහි සජීවි අඛණ්ඩ පැවැත්මට පදනම වී ඇති අයුරු දැකිය හැකිය.

එසේම ඩිවි ක්‍රමයට ආවේනික දුර්වලතා සහ ව්‍යුහමය සීමා සහිත කම් එහි සාර්ථකත්වයට බලපෑම් කරන බව පෙනේ. මේ අනුව සංකීර්ණ විෂය සංකල්ප දෙකක් එක විට ප්‍රකාශනය ගැටලු සහගතය. යුක්ති භාවිතයට ලැබී ඇති සීමිත ඉඩ පරාසය විෂම විශ්ලේෂණය සහ ප්‍රසාරණිතාව රැක ගැනීමට ප්‍රබල බාධකයකි. (200), සමාජීය විද්‍යා (300), ඉතිහාසය හා භූගෝලය (900), යනාදි ප්‍රධාන වර්ග පංති විෂමතා සහගත වර්ග පංති ලෙස විවාදිතය. එසේම බටහිරට පක්ෂපාති වීම නොවිසඳුනු ගැටලුවකි.

ඩිවි ක්‍රමයට අනන්‍ය වූ මෙබඳු නිශේධනීයතා පැවතිය ද සුවිශේෂත්වය වනුයේ ගැටලු විසඳා ගනිමින්, ප්‍රායෝගික වර්ග ක්‍රමයක් ලෙස ප්‍රවර්ධනයට ඊට ඇති ශක්‍යතාවයයි. මේ සඳහා සාධනීය ක්‍රියාමාර්ග තත්කාලීන සංස්කරණ මගින් අනවතරයෙන් ගැනෙමින් පවති. මේ අනුව ඩිවි 22 සංස්කරණයෙන් නව ප්‍රවේශ රාශියක් හඳුන්වා දී ඇති බවත්, ඒවා කාලීන විෂය තාක්ෂණික සහ වර්ගීකරණ අවශ්‍යතා හා සමපාත වන බවත්, එනිසාම නව සහශ්‍රයේහිලා ඒවායේ සාපේක්ෂ වටිනාකම ප්‍රශස්ත බවත්, පැහැදිලි වනු ඇත.

### ආශ්‍රිත ග්‍රන්ථ


01. Dewey Decimal Classification and Relative Index : 20th ed.1989.

02. Dewey Decimal Classification and Relative Index : 21th ed.1996.

03. Dewey Decimal Classification and Relative Index : 22th ed.2003.

04. Comaromi, John p.Satiõ, M. p. Exercises in the 20th Edition of Dewey Decimal Classification, New Delhi : Sterling, 1990.

05. තිලකබන්දු, එච්. "ඩිවි දශම වර්ගීකරණයේ 20 වන සංස්කරණය සහ ප්‍රවණතා" පුස්තකාල විද්‍යාව : සද්ධර්මාකර ශාස්ත්‍රීය ලිපි සරණිය, - 1994. පි. 124 - 135

06. විජේකෝන්, ඩබ්.එම්.ඒ.කේ "21 සියවසට ඩිවි දශම වර්ගීකරණයේ සාපේක්ෂ වැදගත්කම" පුස්තකාල ප්‍රවෘත්ති. කොළඹ: ජා.පු.සේ.ම., 2002 පි 19 - 24

# ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන සේවා

## පුහුණු පාඨමාලා

- සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන කටයුතු පිළිබඳ ප්‍රායෝගික හා න්‍යායාත්මක පුහුණු වැඩමුළුව

  අදියර : 1
  
  කාලය : දින තුනයි (පැය 24 යි)
  
  පාඨමාලා ගාස්තු : රු. 3000.00
  
  අදියර : 2
  
  කාලය : දින දෙකයි (පැය 16 යි)
  
  වැඩමුළු ගාස්තු : රු. 2000.00

- කාර්යාල නිලධාරීන් හා ලේඛනාගාර භාර නිලධාරීන් සඳහා ලේඛන සංරක්ෂණ හා පොත් බැඳුම්කරණය පිළිබඳ පුහුණු වැඩමුළුව

  කාලය : දින දෙකයි (පැය 16 යි)
  
  වැඩමුළු ගාස්තු : රු. 3000.00

- පුස්කොළ පොත් සංරක්ෂණ වැඩමුළුව

  කාලය : දින දෙකයි (පැය 16 යි)
  
  වැඩමුළු ගාස්තු : රු. 2500.00

## පුස්තකාල පොත් ධූමායන කටයුතු

ඔබගේ පුස්තකාලයේ හෝ පෞද්ගලික පොත් එකතුවේ කෘමි, දිලීර මර්දනය සඳහා ධූමායන ප්‍රතිකර්මය සිදු කරනු ලැබේ. (රසායන ද්‍රව්‍ය සඳහා පමණක් මුදල් අය කරනු ලැබේ)

## පොත් බැඳුම් ද්‍රව්‍ය හා උපකරණ අලෙවි කිරීම

රෙක්සින්, චිප් බෝඩ්, සුදු රෙදි, කාකි රෙදි, නූල් පන්දු, කෙම්ගික්ස්, මාබල් කොළ, කාට්රිජ් කොළ, එතුම් කොළ සහ ලෙදරට් කොළ අඩංගු පොත් බැඳුම් ද්‍රව්‍ය කට්ටලයක් රු. 4500.00 ක මිලකට සහ පොත් බැඳීම සඳහා භාවිත කරනු ලබන රු. 1500.00 ක් වටිනාකමින් යුත් බැඳුම් උපකරණ කට්ටලයක් මණ්ඩලයීය පොත් අලෙවි හලෙන් මිල දී ගත හැක.

**මේ පිළිබඳ වැඩිදුර තොරතුරු**

**සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන අංශයේ අංශ ප්‍රධාන වෙතින් ලබා ගත හැකිය.**

**(දුරකථන අංක : 011 2688855 දිගුව 259)**

# இலங்கை நூலக வரலாறும் அதன் வளர்ச்சியும்

எம். எஸ். எம். ஷிஹாம்
நூலக உதவியாளர்
இலங்கைத் தேசிய நூலகம்

மனிதனின் தகவல் பரிமாற்ற காலம் தொட்டு பல்வேறு சாதனங்களின் மூலம் எழுதப்பழகிக் கொண்டமை, அச்சீட்டு சாதனங்களின் வருகை மற்றும் அத்துடன் தொடர்பான நூல் அபிவிருத்தி, நவீன தகவல் தொடர்பு சாதனங்கள் அதனுடன் இயைந்த நூலக வளர்ச்சி போன்ற பல்வேறு கால கட்டங்களில் ஏற்பட்ட சாதனங்களின் வளர்ச்சி போன்ற முக்கிய அடிப்படைகளைக் கொண்டே எலகலாவிய நூலகங்களின் ஆரம்பம், அதன் வளர்ச்சி என்பன நோக்கப்படுகின்றன. என்றாலும், உலகலாவிய நூலக வளர்ச்சியை ஆய்வு செய்கின்ற வரலாற்றாசிரியர்கள் வாய்மொழியிலான தகவல் தளத்தை விட, எழுத்துருவிலான தொடர்பாடல் சாதனங்களின் தோற்றத்தில் இருந்தே நோக்குகின்றனர் என்பது நோக்கத் தக்கது. இலங்கை நூலக வரலாறும் இவ்வாறானதொரு அடிப்படையிலிருந்தே நோக்கப்படுகிறது.

இலங்கை நூலக வரலாரானது உலகலாவிய ரீதியான தன்மைகளையொத்ததாக காணப்படாவிடினும் ஒரு நீண்ட நூலக வளர்ச்சியை அவதானிக்கக் கூடியதாகவுள்ளது. இலங்கையில் நூலக வரலாறு பற்றிச் சிந்திக்கின்ற போது எழுத்துக்கலை மீதான தோற்றம் பற்றிய நோக்கு முக்கியமானது. மகிந்தனின் வரவின் முன்னர் கற்களில் எழுதும் பழக்கம் காணப்பட்டதாக அறியக்கிடைத்திருந்தாலும் இவரின் வருகையின் பின்னரே எழுதும் பழக்கம் உண்டானது எனப்படுகிறது. மேலும் கி.மு. 3 ஆம் நூற்றாண்டின் ஆரம்பத்தில் மகாவிகாரை பாரிய கல்வி நிறுவனமாக காணப்பட்டது. உள்ளூர் மற்றும் சர்வதேசத்தவர்கள் இந்நூலகத்தைப் பயன்படுத்தினர். இந்நூலகமே இலங்கையின் முதலாவது நூலகமாக கணிக்கப்படுகின்றது. மேலும் அநுராதபுர காலத்தின் முக்கிய கல்வி நிறுவனங்களான அபயகிரி, ஜேதவனராம போன்ற விகாரைகளில் நூலகங்கள் இருந்துள்ளன.

இலங்கையின் நூலக வரலாற்றில் முக்கியமான அம்சமாக கி.மு. 103 இல் ஆட்சி செய்த பாஹியன் என்ற மன்னன் திரிபிட்டக்க நூலினை உருவாக்கியதைக் கூறலாம். இவ்வாறு எழுதப்பட்ட நூல்களின் பிரதிகள் ''பொத்குல்'' எனப்படுகின்ற நூலகங்களில் வைக்கப் பட்டிருந்தன. இவை தவிர அநுராதபுர காலத்தில் நூலக நடவடிக்கைகள் நடந்துள்ளதாக அறியக்கிடைக்கின்றது. அதில் உயர் தரம்வாய்ந்த எழுத்துக்கலையொன்று இருந்துள்ளதனை அறிந்து கொள்ளலாம். அநுராதபுரத்தின் சீகிரிய கல்வெட்டுக்கல் இதனை உறுதி செய்துள்ளது. என்றாலும் அது தொடர்பான அதிக தகவல்கள் அறியக்கிடைப்பதில்லை. இதனைத் தொடர்ந்து பொலந்நறுவை நூலக வரலாறு ஆரம்பிக்கின்றது. புராதன நூலக வளர்ச்சியல் 1ஆம் பராக்கிரமபாகு முக்கியமானவர். இவர் இரண்டு பொத்குல்களை பொலந்நறுவையிலும், 128 நூலகங்களை ருகுணுவிலும் அமைத்தார். தற்போது பொலந்நறுவையில் காணப்படுகின்ற பொத்குல் விகாரை இவராலேயே அமைக்கப்பட்டதாகவும் நம்பப்படுகின்றது. பராக்கிரமபாகு அரசனினால் கட்டப்பட்ட சகல ஆலயங்களிலும் பொத்குல்கள் இருந்துள்ளதாக அறியக்கிடைக்கின்றது. இங்கு காணப்பட்ட நூல்களை வாசிப்பதற்காக வெளிநாடுகளிலும் இருந்து மக்கள் அக்காலத்தில் இங்கு வந்ததாக நம்பப்படுகின்றது. பொலந்நறுவைக்கால மன்னரான நிஸ்ஸங்கனின் காலத்தில் நூலகத்துரை வளர்ச்சி கண்டிருந்தது. விசேடமாக செம்புத் தகடுகளில் எழுதுவதற்கான ஏற்பாடுகளை இவர் செய்திருந்தார். மேலும் இவரின் காலத்தில் நூலகங்களுக்கு தனியான பொறுப்பாளர்கள் இருந்துள்ளனர்.

1505 இல் போர்த்துக்கீசரின் வருகையின் பின்னர் கடதாசித் தொழில்நுட்பம் ஆரம்பமாகியது. இதன் பின்னர் ஒல்லாந்தர் வருகையின் பின்னர் 1737இல் அச்சு இயந்திரம் அறிமுகப்படுத்தப்பட்டது. இதனூடு நூலக வளர்ச்சியின் அடுத்த கட்ட வளர்ச்சி ஆரம்பிப்பதனை அவதானிக்கலாம். இதன் பின்னர் ஆங்கிலேயர் வருகையின் பிற்பட்ட காலங்களில் அதிக பௌத்த விகாரைகள் ஆரம்பிக்கப்பட்டு பொத்குல்கள் அதிகம் ஆரம்பிக்கப்பட்டன.

19ஆம் நூற்றாண்டில் பல அச்சிடப்பட்ட சாதனங்கள் வெளியிடப்பட்டதுடன், இக்காலத்தில் நூலகத்துறையில் ஏற்பட்ட முக்கிய மாற்றம் இங்கிலாந்து, அமெரிக்கா போன்ற நாடுகளில் போன்று தனியார் நூலகங்கள் ஏற்பட்டடைமயாகும். மக்களின் அங்கத்துவப் பணத்தின் மூலம் இவை கொண்டு நடாத்தப்பட்டன. முதன் முதலாக Micheal Lougton என்ற வியாபாரி 1801இல் கொழும்பில் அங்கத்துவ நூலகமொன்றினை உருவாக்கினார். பின்னர் கண்டி, காலி போன்ற நகரங்களில் 1839 காலமாகின்ற போது தனியார் நூலகங்கள் ஆரம்பிக்கப்பட்டன.

இலங்கை நூலக வரலாற்றில் முக்கிய ஒரு நிகழ்வாக, 1870இல் Oriental Libray ஆரம்பிக்கப்பட்டதை குறிப்பிடலாம். பிற்பட்ட காலங்களில் ஆரம்பிக்கப்பட்ட பொது நூலகங்களின் வளர்ச்சிக்கு இது முன்னோடியாகக் காணப்பட்டது. இதனைத் தொடர்ந்து அக்கால இலங்கை ஆட்சியாளர் சேர் விலியம் கிரகரி என்பவரின் முயற்சியால் கல்வி நடவடிக்கைகளில் ஈடுபடுகின்றவர்களின் நலன் கருதி 1877இல் நூதனசாலை ஆரம்பிக்கப்பட்டது. 1885 இன் அச்சீட்டாளர் வெளியீட்டாளர் சட்டத்தின் கீழ் இது சட்ட வைப்பு நூலகமாக இது பிரகடனப்படுத்தப்பட்டது.

பொது மக்களின் நலன் கருதி பறந்தளவில் ஆரம்பிக்கப்பட்ட நூலக அமைப்பாக பொது நூலக அமைப்பு காணப்படுகின்றது. 1813இல் ஆரம்பிக்கப்பட்ட கொழும்பு நூலகமும், 1829இல் ஆரம்பிக்கப்பட்ட புரக்கோட்டை நூலகமும் ஒன்றிணைக்கப்பட்டு 1925இல் கொழும்பு பொது நூலகம் ஆரம்பிக்கப்பட்டது. அதன் பின்னர் நாட்டின் பல பிரதேசங்களிலும் பொது நூலகங்கள் ஆரம்பிக்கப்பட்டன. 1850 இன் பொது நூலக சட்டத்தின் கீழ் பொது நூலகங்கள் ஆரம்பிக்கப்பட்டாலும், 1841இல் மத்திய நகர நூலகம் (Central Town Library) என்ற பெயரில் கண்டியில் பொது நூலகமொன்று ஆரம்பிக்கப்பட்டது என்றாலும் கண்டி பொது நூலகம் 1917இல் முறையாக ஆரம்பிக்கப்பட்டது.

இலங்கையில் முக்கிய நூலக வகையாக பல்கலைக்கழக நூலகங்கள் காணப்படுகினறன. 1921இல் கொலேஜ் ஹவுஸ் கட்டிடத்தில் ஆரம்பிக்கட்ட Ceylon Universty College எனப்பட்ட பல்கலைக்கழகத்தில் 1500 நூல்களைக் கொண்டதாக முதலாவது பல்கலைக்கழக நூலகம் ஆரம்பிக்கப்பட்டது. இது பின்னர் பேராதனைக்குக் கொண்டுசெல்லப்பட்டது. 1870 இல் ஆரம்பிக்கப்பட்ட வித்தியோதய பிரிவெனா மற்றும் 1876 இல் ஆரம்பிக்கப்பட்ட வித்தியாலங்கார பிரிவெனா என்பன 1959இல் பல்கலைக்கழகமாக மாற்றப்பட்டது. இதில் ஒரு நூலகம் அமைக்கப்பட்டது. 1972 இல் கட்டுபெத்த, 1979 இல் ருஹுன 1996 இல் ரஜரட்ட போன்ற பல்கலைக்கழக நூலகங்கள் அமைக்கப்பட்டன.

இலங்கையில் காணப்படுகின்ற இன்னொரு நூலக வகையாக விசேட நூலகங்கள் காணப்படுகின்றன. இவை ஒரு குறிப்பிட்ட ஒரு நிருவனத்தின் நூலக தேவையைப் பூர்த்தி செய்யுமுகமாக அமைக்கப்படுகின்றது. இவை அரச திணைக்களங்கள் மற்றும் அரச நிறுவனங்களில் முதலில் ஆரம்பிக்கப்பட்டன. இந்த வகையில் 1925இல் தேயிலை ஆராய்ச்சி நிறுவன நூலகம், 1936இல் ரப்பர் ஆராய்ச்சி நிறுவன நூலகம், 1950இல் மத்திய வங்கி நூலகம் என்பன ஆரம்பிக்கப்பட்டன.

இலங்கையில் அறிமுகப்படுத்தப்பட்ட இலவசக் கல்வியானது, அரச பாடசாலைகளை ஊக்குவிப்பதாக அமைந்தன. எனவே 1945இல் இலவசக் கல்வியின் வருகையுடன் பாடசாலை நூலகங்களும் ஆரம்பிக்கப்பட்டன. பாடசாலை நூலகங்கள் அமைப்பது தொடர்பான சட்டமூலமொன்று 1960இல் கொண்டு வரப்பட்டது. மேலும் 1961இல் நியமிக்கப்பட்ட கல்வி தொடர்பான தேசிய ஆணைக்குழுவும் இது தொடர்பாக சிபார்சு செய்தது. இதன் பின்னர் பாடசாலை நூலகங்கள் ஆரம்பிக்கப்பட்டு இன்று தலைசிறந்த பாடசாலை நூலகங்களை இலங்கை கொண்டுள்ளது. மேலும் சர்வதேச நிறுவனங்களின் உதவியுடன் பல பாடசாலை நூலக அபிவிருத்தித் திட்டங்களும் முன்னெடுக்கப்படுகின்றன.

சுதந்திரத்தின் பின்னர் 1955 இல் சொக்ஸி நிருவாகக் குழு, 1958 இல் கந்தையா நிறுவாகக் குழு, 1959 இன் புரோகியர் குழு, 1960இன் வில்மட் ஏ பெரேரா குழு என்பன இலங்கைக்கு ஒரு தேசிய நூலகம் ஆரம்பிக்கப்படுவதன் முக்கியத்துவத்தினை உணர்த்தி நின்றன. மேலும் 1967 இல் கொழும்பில் நடாத்தப்பட்ட யுனெஸ்கோ சர்வதேச நூலக வல்லுனர்களின் கூட்டமும் இதனை உணர்த்தின. இதன்படி 1970 இல்

தேசிய நூலக சேவைகள் சபை உருவாக்கப்பட்டு, 1990 இல் தேசிய நூலகம் ஆரம்பிக்கப்பட்டது. இது 1998 இல் தேசிய நூலக ஆவணவாக்கல் மத்திய நிலையம் என பெயர் மாற்றம் பெற்றது.

இலங்கை நூலக வரலாற்றில் முக்கியமாக இலங்கை நூலக சங்கம் அமைக்கப்பட்டதனையும் கூறலாம். 1960 இல் உருவாக்கப்பட்ட இதற்கு, 1974 இல் சட்ட அந்தஸ்த்து வழங்கப்பட்டது. இலங்கையில் நூலகக் கல்வியை வழங்குகின்ற முக்கிய ஒரு நிறுவனமாக அது காணப்படுகின்றது. மேலும் இலங்கை நூலகக் கல்வி வரலாற்றில் இன்னொரு முக்கிய அம்சமாக நூலக தகவல் விஞ்ஞானத்திற்கான தேசிய நிருவனம் 1999 இல் கொழும்புப் பல்கலைக்கழகத்தின் ஒரு துனை நிறுவனமாக ஆரம்பிக்கபட்டதை குறிப்பிடலாம் நூலகத்துறை சார்ந்தவர்களுக்கு பல குருங்கால மற்றும் நீண்ட காலப் பயிற்சி நெறிகளை மேற்கொள்கிறது. குறிப்பாக பாடசாலை நூலகர்களை மையப்படுத்திப பல பயிற்சி நெறிகளை மேற்காள்கிறது.

இவ்வாறு இலங்கையின் நூலக வளாச்சியானது ஆரவாரமின்றி மெதுவாக ஆரம்பித்து தற்போது போற்றத்தக்க ஒரு வளர்ச்சியைக் கண்டுள்ளது. என்றாலும் கூட எமது அண்டைய நாடுகளுடன் ஒப்பிடகின்ற போது அது போற்றத்தக்கதாக இல்லை என்ற அவதானமே பலராலும் முன்வைக்கப்படுவதனை அவதானிக்கலாம்.

உசாத்தணைகள்:
1. புஸ்தகால இதிஹாஸய/ W K M M K வீரசிங்க
2. பரணி லங்காவே பொத்குல் சம்பிரதாய/ R H I S ரணசிங்க
3. விஷ்வ தனுமட. மக பென்வன புஸதகால அத்பொத/ பேமசந்திர மாகம்மன
4. சிறீ லங்காவே புஸதகால இதிஹாஸய/ திலக் குணரத்ன
5. Libraries in Sri Lanka: origin and history/ T G Piyadasa
6. புரான லங்காவே பொதகுல் ஹா ஏவா ஆரக்ஷாவட பிக்சூன்கென் ஸிதுவூ ஸேவய/ நாத்தன்டியே பஞ்ஞாகர தேரர்.-Ceylon Library review vol. 2, no. 1 7-13p.
7. பெரணி கம் புஸ்தகால/ வில்பிரட் எச் குணசேகர.- Sri Lanka Library review.- vol. 4, no.2. 117-119p.


## මණ්ඩලයීය ප්‍රකාශන

1. ජාතික ග්‍රන්ථ නාමාවලිය

   රු.100.00

2. ජාතික ග්‍රන්ථ නාමාවලිය-01

   රු.100.00

3. වාර සඟරා ලිපි අනුක්‍රමණිකාව

   රු.100.00

4. රජයේ ප්‍රකාශන නාමාවලිය

   රු.200.00

5. පශ්චාත් උපාධි නිබන්ධන

   අනුක්‍රමණිකාව රු.375.00

6. පුස්තකාල ප්‍රවෘත්ති

   රු.50.00

7. ඩිවි දශම වර්ගීකරණය

   (සිංහල) රු.300.00

8. Index to Research Report

   2005-2009 රු. 260.00

මෙම ද්‍රව්‍ය ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අළෙවිහලෙන් ලබාගත හැකිය.

විමසීම් : 0112698847, 0112685197

# ග්‍රන්ථ විඥාපන පාලනයේ ඓතිහාසික පසුබිම හා ශ්‍රී ලංකාවේ අනාගත අභියෝග

විජය ප්‍රේමදර්ශන
පුස්තකාල සංවර්ධන සහකාර
අංශ ප්‍රධාන - ක්‍රමෝපායන සැලසුම් අංශය
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

ලෝකයේ දිනෙන් දින ම විවිධ විෂයයන්ට අයත් තොරතුරු බිහිවීම අධ්‍යාපනය හා තාක්ෂණයේ දියුණුවත් සමඟ ඉහළ යමින් පවතී. මේ නිසා පොත්පත් ඇතුලු තොරතුරු ප්‍රකාශන ද්‍රව්‍ය උත්පාදනය කරන පිරිසගේ ද වැඩිවීමක් දැකිය හැකිය. මෙසේ ගොඩනැගෙන තොරතුරු විවිධ ස්වරූපයෙන් පැවතිය ද තොරතුරුවල අවශ්‍යතා ඇති උපයෝජකයන් හා පර්යේෂකයන්ගේ ද වර්ධනය ශීඝ්‍රයෙන් ඉහළ යන බව පෙනේ. තොරතුරුවල ස්වරූපය අනුව ඒවා පොත්, වාර සඟරා, පුවත්පත්, වාර්තා, සම්මන්ත්‍රණ පත්‍රිකා, රජයේ ප්‍රකාශන සහ ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය ආදි වශයෙන් ක්‍රමයෙන් ආරම්භයේ සිට වර්ධනය වී පැමිණිය ද පරිගණකය ඇතුළු තාක්ෂණික දියුණුව හේතුවෙන් අද සංයුක්ත තැටි (CD) වර්ග සහ විද්‍යුත් ප්‍රකාශන (E-publications) යනාදිය ද තොරතුරු මූලාශ්‍ර වශයෙන් අධිවේගයෙන් බිහිවීම සිදු වේ.

එබැවින් මෙය වඩාත් සංකීර්ණ වනුයේ තොරතුරු මූලාශ්‍ර ගවේෂණය කරන්නන්ට පහසුවෙන් ළඟාවීමට නො හැකි වීමෙනි. මේ සඳහා ග්‍රන්ථ විඥාපන පාලනයක් ඇති කළ යුතු බව අතීතයේත්, වර්තමානයේ දීත්, පුස්තකාල හා විඥාපන ක්ෂේත්‍රයේ වෘත්තිකයන්ටත්, විශේෂඥයින්ට මෙන් ම ප්‍රලේඛන නිලධාරීන්ට ද වැටහිණි. ඉතා වේගයෙන් බිහිවන තොරතුරු අවශ්‍ය වේලාවට අවශ්‍ය කරන අය සඳහා පහසුවෙන් සොයා ගැනීම වෙනුවෙන් සකස් කරනු ලබන ක්‍රමවේදය විඥාපන පාලනය (Bibliographic Control) ලෙස හැඳින් වේ.

මේ ආකාරයෙන් මිනිස් දැනුම හා තොරතුරු ඉදිරිපත් කරන සියලු ආකාරයෙන් ප්‍රකාශිත මුද්‍රිත ද්‍රව්‍ය, ශ්‍රව්‍ය හා දෘශ්‍ය ස්වරූපයකින් ප්‍රදර්ශනය වන ද්‍රව්‍යයන් පිළිබඳ ව විස්තර ප්‍රමාණවත් ලෙස වාර්තාගත කිරීම මෙම ග්‍රන්ථ විඥාපන පාලනයට අඩංගු වේ.

ඒ අනුව දෛනික ව ලෝකයේ සෑම රටක ම එකතුවන තොරතුරු මෙවලම් ප්‍රමාණයෙන් අති විශාල ය. එසේ ම මේවායේ අවශ්‍යතාව ඇති නැතහොත් මේවා සොයන පිරිස ද ඒ හා සමාන ව සිටිති. මෙසේ බිහිවන විවිධ තොරතුරු අඩංගු ප්‍රකාශන වර්ග හඳුනාගෙන ඒවා සම්බන්ධ නිවැරදි ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු ඇතුළත් වාර්තා හැකි ඉක්මනින් පිළියෙල කොට ඒවා අවශ්‍ය කරන මහජනයා හට ලබාදීම සඳහා මුද්‍රිත හෝ වෙනත් ස්වරූපයකින් වාර්තා ඉදිරිපත් කිරීම මෙහි දී සිදුකළ යුතු ය. මෙය එම රටවල් තුළ සිදුකළ යුතු ජාතික කාර්යයක් වේ. ඒ අනුව රටක් තුළ බිහිවන තොරතුරු මූලාශ්‍ර ක්‍රමයෙන් ඉහළ යන විට මේවා පාලනය කිරීම පිණිස කිසියම් වූ විද්‍යාත්මක පදනමක් අනුගමනය කළ යුතු වේ. මේ සඳහා තොරතුරු විඥාපන ක්ෂේත්‍රයේ සිටි විද්වතුන් විසින් ජාත්‍යන්තර ව පිළිගත් ග්‍රන්ථ විස්තර අඩංගු කොට ග්‍රන්ථ විඥාපන පාලනයක් සිදු කිරීමට පෙරමුණ ගෙන තිබේ.

## ග්‍රන්ථ විඥාපන පාලනයේ ඉතිහාසය

ග්‍රන්ථ විඥාපන පාලනය යන යෙදුම 20 වන සියවසේ සිව්වන දශකයේ දී පමණ හඳුනා ගත්ත ද මෙහි ඉතිහාසය වසර 5000කට පෙර ***යුප්‍රටීස් ටයිග්‍රීස්*** යුගවල දී අක්ෂර බිහි වූ කාලය දක්වා දිවේ.

මේ අනුව එම කාල වකවානුවල පැවති තාක්ෂණයට අනුව ගල්, මැටිපුවරු, ගස්වල පොතු, සත්ව හම්, තඹපත්, පුස්කොළ හා කඩදාසි යන ඒවායේ දැනුම සඳහා ඇති තොරතුරු සටහන් කර ඇත. මේ අනුව ග්‍රන්ථ විඥාපන පාලනයක් එකල පවා තිබූ බවට පුරාණ ***ඇලෙක්සැන්ඩ්‍රියානු*** පුස්තකාලයේ අන්තර්ගත ලේඛන තොරතුරු පිළිබඳ සූචි (Catalogues) සාක්ෂි දරයි. බොහෝ විට මේවායේ රජවරුන්ගේ, රාජ්‍ය ප්‍රභූවරුන්ගේ හා රාජ්‍ය නිලධාරීන්ගේ බදු හා ආදායම් විස්තර ආදිය පිළිබඳ ව වාර්තා තබා තිබේ. මේවා පාලනය කිරීමට එකල ගබඩා පාලකයෙක් (Record Keeper) රජය විසින් පත්කර ඇති බව පෙනේ. එහි දී දත්ත සටහන් කිරීම, ගබඩා කිරීම හා රැක බලා ගැනීම යනාදිය ඔහුට අයත් වූ කාර්යයන් ය, මෙම ලේඛන ගබඩා කොට තැබුවේ ගබඩා කාමර (Record Rooms) වල යි, එහෙත් එකල මෙම දත්ත වාර්තා සංඛ්‍යාත්මක ව අඩු හෙයින් තොරතුරු විඥාපන පාලනයක අවශ්‍යතා දැඩි ව මතු නො විය.

එහෙත් ක්‍රි. පූ. 105 දී පමණ චීන ජාතික ***"සායි ලූං"*** නැමැත්තා විසින් කඩදාසි සොයා ගැනීමත් සමඟ ම මුද්‍රණ ශිල්පය ද ප්‍රථමයෙන් චීනයේ බිහි වී ඇති බවට සාධක තිබේ. අනතුරුව 16 හා 17 වන සියවස්වල යුරෝපයේ සිදු වූ කාර්මික විප්ලවයෙන් පසු මෙම ක්ෂේත්‍රයේ ද විශාල පරිවර්තනයක් සිදු වී තිබේ. එනම් ජර්මන් ජාතික ***"ජොහැන්නස් ගුටන්බර්ග්"*** විසින් මුද්‍රණ යන්ත්‍රය හඳුන්වා දීමත් සමග ප්‍රකාශන ක්ෂේත්‍රයේ විශාල ව්‍යාප්තියක් යුරෝපීය රටවල සිදුවීමයි. අනතුරුව මෙය ව්‍යාපාරික කර්මාන්තයක් වශයෙන් ලෝකයේ සෙසු රටවලට ද ව්‍යාප්ත වී තිබේ. මේ ආකාරයෙන් මුද්‍රණ කර්මාන්තයත් ප්‍රකාශන ක්ෂේත්‍රයත් තරඟකාරී අයුරින් ගමන් කිරීම නිසා තොරතුරුවල බිහිවීම සීඝ්‍රයෙන් ඉහළ ගොස් තිබේ.

මෙසේ ආරම්භ වී ඇති තොරතුරු දත්ත අනාගත පරපුර සඳහා ගබඩා කිරීමටත්, ඒවායේ පාලනය සහ සේවාව සඳහා පුස්තකාල සහ ඒ හා සමාන ව ඇති වෙනත් ආයතන විසින් කටයුතු කර ඇත.

ඒ අතරින් ජාතික පුස්තකාල (National Libraries), ජාතික ලේඛනාගාර (National Archives), කෞතුකාගාර (Museums) සහ විශ්ව විද්‍යාල (Universities) යන ඒවා රාජ්‍ය අනුග්‍රය යටතේ පවත්වාගෙන ගොස් තිබේ. පළමු වරට 1811 දී ප්‍රංශයේ අධිරාජ්‍යයෙකු වූ ***"නැපෝලියන්ගේ"*** ආඥාවකට අනුව (Bibliographic de La France) නැමති ප්‍රථම ග්‍රන්ථ නාමාවලිය බිහි වී ඇති බව වාර්තා වේ. මෙය ජාතික වශයෙන් එම රට විසින් සිදුකර ඇති ජාතික ග්‍රන්ථ නාමාවලිය (National Bibliography) වශයෙන්ද එය සමස්ත විශ්වයට ම බලපාන හෙයින් විශ්ව ග්‍රන්ථ විඥාපන පාලනය සම්බන්ධයෙන් ද වැදගත් වේ. මේ සඳහා (Konrad Gesner) විසින් (Bibliotheca Universals) 1516 - 1565 යන ග්‍රන්ථ නාමාවලිය ඒ කාලයේ දී හඳුන්වා දී ඇති අතර ලතින්, ග්‍රීක් සහ හීබෲ යන විවිධ භාෂාවලින් මෙම ග්‍රන්ථ නාමාවලිය සකස් කර තිබේ. ඊට පසු **(Thomas Watt, Jacques Runet, William Lowndes)** යන අය ද ග්‍රන්ථ විඥාපන පාලනය සඳහා මුල් කාලයේ දී දායකත්වයක් දැක් වූ අය අතර සිටිති. කෙසේ වෙතත් අතීතයේ පුස්තකාල සහ තොරතුරු සම්පත් ගබඩාකර තිබූ ආයතන භාවිත කළේ එක්තරා තෝරාගත් ප්‍රභූ පිරිසක් හෙයින් ඔවුන්ට අවශ්‍ය තොරතුරු සොයා ගැනීම ද එතරම් ගැටලුවක් නො වුණි.

නමුත් ලෝකයේ දැනුම බිහිවන වේගය ඉතාමත් ඉහළින් සිදුවන නිසා තොරතුරු ගබඩා කිරීම, සංවිධානය කිරීම සඳහා යම් විද්‍යාත්මක ක්‍රමවේදයක් අනුගමනය කිරීමට පටන්ගෙන තිබේ. එහි දී මේ කෙරෙහි අන්තර්ජාතික වශයෙන් පිළිගත් ප්‍රමිති විස්තරවල අවශ්‍යතාව මතුවිය. ග්‍රන්ථ විද්‍යාත්මක විස්තර අඩංගු කොට සකස් කරන ලද වාර්තාව ග්‍රන්ථ නාමාවලිය (Bibliography) ලෙසට හා සමහර රටවල එය අනුක්‍රමණිකාව (Index) ලෙසට සකස් කර ඇත්තේ විඥාපන තොරතුරු සොයාගැනීමට පහසුවීම සඳහා ය. ලෝකයේ පොත් මුද්‍රණය සිදුවීමත් සමග එම පොත් මිලදී ගැනීමට මෙම ග්‍රන්ථ නාමාවලිය ආරම්භ කර ඇති බවට සාක්ෂි ඇත.

ඒ අනුව ජර්මනියේ ෆ්‍රැන්ක්ෆර්ට් හා ලයිප්සිග් යන නගරවල පැවති ක්‍රිස්තියානි දේවස්ථාන ආශ්‍රිත පොත් සල්පිල්වල පොත් අලෙවි කිරීම සඳහා ප්‍රථම වරට පොත් වෙළෙන්දන්ගේ නාමාවලියක් බිහිවී තිබේ. එය Mess Katalogues in Germany 1560-1860 නමින් හඳුන්වා ඇත. ඒ අයුරින් අවුස්බර්ග් (Ausberg) හි පොත් වෙළෙන්දෙකු වන "ජෝර්ජ් විලර්" විසින් 1564 දී ප්‍රථම වරට ග්‍රන්ථ නාමාවලියක් සැකසූ බවට සඳහන් වේ.

අනතුරුව ග්‍රන්ථයක කර්තෘගේ වාසගම මුලට යොදා ග්‍රන්ථ නාමාවලියක් Andrew Marsel විසින් සකස් කර ඇති අතර, එය Catalogue of English Printed Book - (1595) යනුවෙන් හැඳින් වේ. මේ අතරතුර ලෝකයේ පවතින විවිධ රටවල් ග්‍රන්ථ විඥාපන පාලනය සඳහා පුස්තකාල සහ වෙනත් එවැනි ආයතන විසින් ග්‍රන්ථ නාමාවලි, අනුක්‍රමණිකා, සූචි, (Catalogues), සාරසංග්‍රහ, (Abstracts) දත්ත පදනම්, (Data Base) ආදිය සකස් කරමින් මේ සඳහා ගෙන ඇති විවිධ ප්‍රයත්නයන් අගය කළ යුතු වේ. ඒ අනුව ජාත්‍යන්තර ව මේ සඳහා අවධානය යොමුකර කටයුතු කරන සංවිධානයක් වන එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන විද්‍යාත්මක හා සංස්කෘතික සංවිධානය (UNESCO) සෘජුව ම මැදිහත්වීම වැදගත් ය. 1946 දී ආරම්භ කරන ලද මෙම සංවිධානය විසින් සකස්කර ඇති වාර්තාව Mastery Over Written Records ඇමරිකාවේ කොන්ග්‍රස් පුස්තකාලයේ ප්‍රකාශනයක සටහන් කර තිබේ. (රණසිංහ, 1995, 6 - 9) ඒ අනුව ලෝකයේ පවතින සියලු ම රටවල ජනතාවට ඕනෑම රටක මුද්‍රිත ප්‍රකාශන ද්‍රව්‍යවලට ප්‍රවේශ වීමට ඉඩසැලැස්වීම මෙම වාර්තාවේ අරමුණ වී ඇත. කෙසේ වෙතත් යුනෙස්කෝ සංවිධානයේ විශේෂ අවධානය මේ කෙරෙහි යොමුවීමත් සමඟ ග්‍රන්ථ විඥාපන පාලනය සම්බන්ධයෙන් යම් පිබිදීමක් සිදු වී ඇති බව පෙනේ. මෙය ක්‍රියාකාරී තත්වයට ගෙන ඒම සඳහා විවිධ සමීක්ෂණ සම්මන්ත්‍රණ හා සමුළු පවත්වා තිබේ. ඒවා මේ ආකාරයෙන් පෙන්වා දිය හැකි ය.

- 1950 දී කොන්ග්‍රස් පුස්තකාලය සමඟ එක්ව ලෝකයේ ග්‍රන්ථ විඥාපන සේවා පිළිබඳ කරන ලද සමීක්ෂණ සහ ඒ හා සම්බන්ධ ප්‍රථම සම්මේලනය පැවැත්වීම.
- 1952 දී අන්තර්ජාතික පුස්තකාල සංගම් සංවිධානය (IFLA) බිහිවීම.
- 1955 දී ආසියාවේ මහජන පුස්තකාල සේවා පිළිබඳ සම්මන්ත්‍රණයක් ඉන්දියාවේ දිල්ලියේ දී පවත්වන ලදී.
- 1954 සිට 1974 දක්වා යුනෙස්කෝ කලාපීය සමුළු හා ජාතික පුස්තකාල විශේෂඥයින්ගේ රැස්වීම් පැවැත්වීම (1958 ඕස්ට්‍රේලියාවේ වියානා නුවර, 1964 පිලිපීනයේ මැනිලා නුවර, 1966 ඉක්වදෝරයේ ක්වේටෝහි දී, 1967 ශ්‍රී ලංකාවේ කොළඹ, 1970 උගන්ඩාවේ කම්පාලා, 1974 ඊජිප්තුවේ කයිරෝ නුවර) යනාදි රටවල පවත්වා ඇත.
- අන්තර්ජාතික පුස්තකාල සංගම් සංවිධානය මේ සඳහා සෘජු ව මැදිහත්වීම හේතුවෙන් 1973 දී නෝර්මොල්හි දී පැවැත්වූණු සම්මන්ත්‍රණය නම් කර තිබුණේ විශ්ව ග්‍රන්ථ විඥාපන පාලනය යනුවෙනි.
- 1974 දී මේ සඳහා (IFLA - International Office for UBC) ආරම්භ කර තිබේ.
- 1974 දි ප්‍රංශයේ පැරිස් නගරයේ දි ජාතික ප්‍රලේඛන සේවා පුස්තකාල හා අධි ලේඛනාගාර සැලසුම් කිරීම පිළිබඳ සම්මන්ත්‍රණයක් පැවැත්වීම.
- 1976 සෝල් නුවර පැවැත් වූ ඉෆ්ලා සම්මන්ත්‍රණයේ දී විශ්ව ප්‍රකාශන සුලභතාව(UAP) පිළිබඳ වැඩසටහන ඉදිරිපත් කරීම.
- 1977 දී පවත්වන ලද යුනෙස්කෝ/ ඉෆ්ලා සමුළුව(International Congress on National Bibliography).

ග්‍රන්ථ විඥාපන පාලනය ජාතික හා ජාත්‍යන්තර වශයෙන් වැදගත් වන පුස්තකාල සූචි, ග්‍රන්ථ නාමාවලි, අනුක්‍රමණිකා සහ සාරසංග්‍රහ, සෑම රටක ම වාගේ ප්‍රකාශයට පත්කර තිබේ. ඒ අතර තියෝඩෝර් බෙස්ටර්මන් **(Theodore Bestermans)** විසින් විශ්ව ග්‍රන්ථ විඥාපන පාලනය සඳහා World Bibliography of Bibliographies යන ග්‍රන්ථ නාමාවලිය පළ කිරීම විඥාපන පාලනයේ එක්තරා සංධිස්ථානයක් ලෙස හැඳින්විය හැකි ය. මේ ආකාරයෙන් ග්‍රන්ථ විඥාපන පාලනය ප්‍රධාන කොටස් දෙකක් යටතේ ක්‍රියාත්මක වූ බව පෙනේ.

1. ජාතික ග්‍රන්ථ විඥාපන පාලනය (NBC)
2. විශ්ව ග්‍රන්ථ විඥාපන පාලනය (UBC)

කිසියම් රටක් තුළ ජාතියේ සියලු ම සාහිත්‍ය පිළිබඳ තොරතුරු වාර්තාගත කිරීම සිදුවේ නම් එය ජාතික ග්‍රන්ථ විඥාපන පාලනය ලෙස හැඳින් වේ. මෙය ජාතික වශයෙන් වැදගත්වන කාර්යයක් හෙයින් ජාතික වශයෙන් සිතා කටයුතු කිරීම ජාතික ග්‍රන්ථ විඥාපන පාලනය වශයෙන් ද සියලු ම රටවල් මේ සඳහා පෙරමුණ ගෙන කටයුතු කිරීම තුළින් ඇතිවන තත්වය විශ්ව ග්‍රන්ථ විඥාපන පාලනය ලෙස ද හැඳින් වේ. යුනෙස්කෝ සංවිධානය මගින් ඉහත කී පරිදි ජාතික පුස්තකාල හා පුස්තකාල සේවා සැලසුම්කරණය සම්බන්ධ සම්මන්ත්‍රණ පැවැත්වූවත් එයින් වඩාත් වැදගත් වූයේ 1958 දී වියානා නුවර දී පැවැති සමුළුවයි. එයට හේතුව ග්‍රන්ථ විඥාපන පාලනය හා ඒ සඳහා අවශ්‍ය සංවිධානාත්මක ව්‍යුහය ඉතා ගැඹුරින් සාකච්ඡා කළ සම්මන්ත්‍රණයක් වීමයි. මේ අතර යුනෙස්කෝ ආධාර මත ඉෆ්ලා ආයතනය මගින් සංවිධානය කරනු ලද සූචිකරණ මූලධර්ම පිළිබඳ ජාත්‍යන්තර සම්මේලනය (International Conference on Cataloguing principles) 1961 පැරිස් නගරයේ දී පවත්වා තිබේ. අනතුරුව ග්‍රන්ථ විඥාපන පාලනය සම්බන්ධයෙන් 1969 කෝපන්හේගන් නුවර දී පැවැත්වූ (IMCE) සූචිකරණ විශේෂඥයන්ගේ ජාත්‍යන්තර රැස්වීම (International Meeting of Cataloguing Experts) වඩාත් වැදගත් වේ.

මෙය ද ඉෆ්ලා ආයතනය විසින් සංවිධානය කරන ලද්දකි. මේ අනුව ග්‍රන්ථ විඥාපන පාලනයේ දී ජාත්‍යන්තර වශයෙන් සිදුකර ඇති වැදගත් විඥාපන සේවා කිහිපයක් මෙසේ ඉදිරිපත් කළ හැකි ය.

- බ්‍රිතාන්‍ය පුස්තකාලයේ (The British Library General Catalogue of printed books)
- Ulrich's International Periodicals Directory
- Science Citation Index
- Online Computer Library Centre (OCLC)
- Directory of Commonwealth Retrospective National Bibliographies
- ඇමරිකා එක්සත් ජනපදයේ කොන්ග්‍රස් පුස්තකාලය විසින් පළ කරන ලද සූචි (A Catalogue of books represented in library of congress printed cards, Library of Congress author catalogues, National Union Catalogue)

**ශ්‍රී ලංකාවේ ග්‍රන්ථ විඥාපන පාලනයේ ඉතිහාසය**

ශ්‍රී ලංකාවේ ප්‍රකාශන සහ ග්‍රන්ථ විඥාපන ඉතිහාසය ගැන සඳහන් කරන විට තුන්වන ලෝකයේ සෙසු රටවලට සාපේක්ෂ ව ඉදිරි පියවර කිහිපයක් ගෙන ඇති බව සතුටින් සඳහන් කළ හැකි ය. මෙහි දී වඩාත් වැදගත් වන්නේ ශ්‍රී ලංකාවේ ප්‍රකාශන ක්ෂේත්‍රයේ සිදු වූ පරිවර්තනයත් සමග ම ප්‍රකාශන සුලභතාව සිදු වී ඇති ආකාරයයි. 1505 සිට 1948 දක්වා කාල පරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකාවේ ප්‍රකාශන ක්ෂේත්‍රයේ විශේෂ සිදුවීම් රාශියක් සිදුවී තිබේ. පළමුවෙන් 1505 ශ්‍රී ලංකාවට සංක්‍රමණය වූ පෘතුගීසි ජාතිකයන්ට අවශ්‍ය වූයේ ඔවුන්ගේ ආගමික ආධිපත්‍ය ශ්‍රී ලංකාව පුරා ව්‍යාප්ත කිරීමටයි. අනතුරුව 1602 පැමිණි ලන්දේසි ජාතිකයින්ට අවශ්‍ය වූයේ ද පෙරදිග ඉන්දියා වෙළඳ සමාගම හරහා ඔවුන්ගේ වෙළඳ අධිකාරිය ශ්‍රී ලංකාව පුරා ව්‍යාප්ත කිරීමටයි. ඉංග්‍රීසි ජාතිකයින් 1796 දී ලංකාවට පැමිණ

1815 න් පසු මුලු රට ම අල්ලා ගත්හ. ඔවුන්ට ද අවශ්‍ය වී තිබුණේ වැවිලි ව්‍යාපාරයට අමතර ව ඔවුන්ගේ දේශපාලන ආධිපත්‍ය මේ රට තුළ ප්‍රචලිත කිරීමයි. කෙසේ වෙතත් මේ විදේශීය ආක්‍රමණිකයන්ගේ පැමිණීම ශ්‍රී ලංකාවේ ප්‍රකාශන ව්‍යාපාරය ඇරඹීමට හා ව්‍යාප්ත වීමට බලපෑ ප්‍රධාන සාධකය වී තිබේ. (ද සිල්වා. 1993, 9-13) 16 හා 17 වන සියවස්වල යුරෝපයේ සිදු වූ කාර්මික විප්ලවයට සමාගාමී ව ආසියානු රටවල ද මේ සම්බන්ධයෙන් යම් යම් විපර්යාස සිදුවී ඇත. මේ අනුව ලංකාවට මුද්‍රණ ශිල්පය හඳුන්වා දී ඇත්තේ ඉහත කී විදේශීය ආක්‍රමණිකයන්ගේ අවශ්‍යතා ඉටුකර ගැනීමට මිස ප්‍රකාශන ක්ෂේත්‍රයේ වර්ධනයක් හෝ ව්‍යාප්තියක් ඇති කිරීම සඳහා නො වන බව පෙනේ. එනම් ඔවුන්ගේ වාණිජමය තොරතුරු ලේඛනගත කිරීම රෙපරමාදු සහ ක්‍රිස්තියානි ආගමික මතවාද දිවයින පුරා ජනතාව වෙත ප්‍රචලිත කිරීම වැනි අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා මුද්‍රණ ශිල්පය ලංකාව. තුළ ස්ථාපිත කරන ලදී. ලංකාවේ මුද්‍රිත පළමු පොත ක්‍රිස්තියානි යාච්ඤා පොතයි. එය ලන්දේසි යාච්ඤා පොත ලෙස ද හැඳින් වේ. මෙය සකස් කර ඇත්තේ එකල යුධ ගබඩාවේ සේවය කළ ගාබ්‍රියෙල් ස්කාදර් (Gabriel Skather) විසිනි.

18 සහ 19 වන සියවස්වල වැවිලි කර්මාන්තයේ සිදු වූ වර්ධනය තුළින් රටතුළ දේශීය ධනපති පන්තියක් හා ඉංග්‍රීසි උගත් නව මධ්‍යම පන්තියක් බිහිවීම නිසා වැඩවසම් අර්ථ ක්‍රමයක සිට ධනවාදී අර්ථ ක්‍රමයක් දක්වා සමාජමය පරිවර්තනයක් සිදුවී තිබේ. මේ කාලයේ දීම ලංකා ගැසට් පත්‍රයට අමතර ව යම් යම් ප්‍රකාශන කිහිපයක් බිහිවී තිබේ. ඒ අතරින් ප්‍රධාන වශයෙන් සඳහන් කළ හැකි කිහිපයක් පහත දැක්වේ.

- ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය - 1802 මාර්තු 15 වෙනි දා ප්‍රකාශයට පත්කිරීම
- ලංකාවේ ප්‍රථම ඉංග්‍රීසි පුවත්පත (Colombo Journal) 1932 දී බිහිවීම
- ප්‍රථම සිංහල පුවත්පත ලංකා ලෝකය - 1860 දී ආරම්භ වීම
- නිල් පොත් (Blue Books) බිහිවීම
- ප්ලැකාට් තෝම්බු හා ලේකම් මිටි

අනතුරුව ලක්මිණි පහන, සිංහල බෞද්ධයා වැනි පුවත්පත් ඇතුළු විවිධ වර්ගයේ පොත් වාරසඟරා යන ප්‍රකාශන රට තුළ මුද්‍රණය කර තිබේ. (හේමපාල, 1986. 16 - 17) 1948 වර්ෂයේ දී ශ්‍රී ලංකාව නිදහස ලැබීමෙන් අනතුරුව රට තුළ සිදු වී ඇති ආර්ථික හා සමාජික පරිවර්තනය ද මෙහි දී සලකා බැලීම වටී. එනම් මීට පෙර රටේ සිදු වී ඇති සමාජ හැල හැප්පීම්, දේශපාලනික සිදුවීම් හා ආර්ථික වෙනස්කම් ආදිය ගැන අධ්‍යයනය හා ගවේෂණය කිරීම සඳහා පසු කාලීන ව පහළ වූ විද්වතුන් උත්සුක වී ඇත. මේ සඳහා තොරතුරු සම්පත් රැස්කර තැබූ පුස්තකාල අතර ලංකාවේ මුලින් ම බිහි වූ කොළඹ ප්‍රාචීන පුස්තකාලය 1870 හා 1877 දී බිහි වූ ජාතික කෞතුකාගාරය හා රාජ්‍ය ලේඛනාගාරය වැනි ආයතනවල ද එකල පළ වූ සමහර ලේඛන නො මැති බව පෙනේ. ඒවා බොහෝමයක් බ්‍රිතාන්‍ය හා නෙදර්ලන්තය වැනි රටවල පුස්තකාල සඳහා රැගෙන ගොස් තිබේ. ලංකාවේ සමහර ස්ථානවල පිටපත් කිහිපයක් තිබුණ ද ඒවා විසිරී පැතිරී තිබුණා මිස විධිමත් ක්‍රමවේදයක් යටතේ සංවිධානය කර නො මැති බැවින් සොයා ගැනීමට පහසු වී නැත. එහෙත් 1839 අංක 05 දරන ආඥා පනතට අනුව ශ්‍රී ලංකාවේ ප්‍රකාශනවල තරමක ග්‍රන්ථ විඥාපන පාලනයක් තිබූ බවට සාක්ෂි ඇත. එම ආඥා පනතට අනුව ලංකාවේ පළකරන පළමු පුවත්පත ප්‍රකාශකගේ අත්සන යොදා යටත් විජිත මහා ලේකම්වරයාට යැවිය යුතු ය. එම පනතේ (To regulate the printing and publishing of News papers in this Colony) ලෙස සඳහන් වේ. (රණසිංහ. 1995. 6 – 9) අනතුරුව 1862 සිට 1884 දක්වා පළකරන ලද (Ceylon Blue Books) හි එවකට ලංකාවේ තිබූ පළාත් අනුව ප්‍රකාශයට පත් කරන ලද පොත්පත්, වාර්තා, ප්‍රකාශන ආදියෙහි විස්තර අඩංගු ලැයිස්තු සටහන් කර තිබේ. මෙය ආසියාවේ රටක ග්‍රන්ථ විඥාපන පාලනය සඳහා ගෙන ඇති එක් පළමු පියවරක් ලෙස හඳුන්වා දිය හැකි ය. 1864 සිට ලැයිස්තුවේ ඉහත විස්තරවලට

අමතරව ව මුද්‍රණාල පිළිබඳව ද තොරතුරු පළකොට ඇත.

ඉන් පසු 1885 අංක 01 දරන මුද්‍රණ කරුවන්ගේ සහ ප්‍රකාශකයන්ගේ ආඥා පනතට අනුකූල ව රටතුළ පළ කරනු ලබන කිසියම් ප්‍රකාශනයකින් පිටපත් 05ක් රාජ්‍ය ලේඛනාගාරයට භාරදිය යුතු වේ. මෙම පනතට අනුව ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ V වෙනි කොටස මගින් මෙම ප්‍රකාශන විස්තර පළකොට ඇත. ඒ අනුව ලියාපදිංචි අංකය, ග්‍රන්ථ නාමය, කර්තෘ, විෂය, මුද්‍රණය, ප්‍රකාශනය, ප්‍රකාශන වර්ෂය, පිටු සංඛ්‍යාව, ප්‍රමාණය, සංස්කරණය, පිටපත් සංඛ්‍යාව, මිල, ප්‍රකාශනය අයත් පුද්ගලයාගේ නම, ලිපිනය ආදි විස්තර සඳහන් කොට ඇත. මෙය ආසියාතු කලාපයේ රටක ග්‍රන්ථ විඥාපන පාලන ඉතිහාසයේ වැදගත් සිදුවීමක් ලෙස පෙන්වා දිමට හැකි ය.

ඉහත පන්තේ සටහන් කර ඇති පරිදි (An Ordinance to provide for preservation of copies of books printed in Ceylon and the registration of such book) (එහි සඳහන් ආකාරයට ලංකාවේ මුද්‍රිත පොත් පිටපත් ආරක්ෂා කිරීම හා එබඳු පොත් ලියාපදිංචිය සඳහා ඉඩ සලසන ආඥා පනතකි) මෙම පනත සම්පාදනය සඳහා එවකට රජයට උපදෙස් දුන් ආචාර්ය ජෝන් මාර්ඩොක් මහතා එක්තරා ආකාරයකට 1867 දී වර්ගීකෘත ග්‍රන්ථ නාමාවලියක් සම්පාදනය කළ අයෙකි. එම කෘතිය (Classified catalogue of printed tracts and book in Sinhalese ) නම් වේ. මෙම පනත 1938 දී පොත් මුද්‍රණය හා ප්‍රකාශනය පාලනය කිරීම හා එම පොත්වල පිටපත් ආරක්ෂා කිරීම හා ඒවායේ විස්තර ලියාපදිංචිය සඳහා ඉඩ සලසන ආඥාපනත යනුවෙන් සංශෝධනය වූ අතර පසුව එය තවදුරටත් 1951 අංක 28 ලෙස ද 1976 අංක 06 වශයෙන් ද සංශෝධනයට ලක් වී ඇති බව පෙනේ. ග්‍රන්ථ විඥාපන පාලනය සඳහා එවකට ලෝකයේ අනෙකුත් රටවල සිදු වූ යම් යම් දෑ අප රට කෙරෙහි ද බලපා තිබේ. විශේෂයෙන් ම යුනෙස්කෝ සංවිධානයේ බලපෑම හා ඒ සඳහා ගෙන ඇති ක්‍රමවේදයන් වෙනුවෙන් පවත්වා ඇති සම්මන්ත්‍රණ සමුළුවල ප්‍රතිඵලයක් වශයෙන් අප රට ද යම් නියෝජනයක් ලබා තිබේ. ඉන් පසුව එච්. ඒ. අයි. ගුණතිලක මහතා විසින් කරන ලද (Bibliography of Ceylon) ග්‍රන්ථ නාමාවලිය ද මෙහි දී වැදගත් වේ. ප්‍රථමයෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ග්‍රන්ථ නාමාවලි අංශය ජාතික ග්‍රන්ථ නාමාවලිය පළ කිරිමට අවශ්‍ය කටයුතු කර ඇති අතර පසුව එය රාජ්‍ය ලේඛනාගාරයට ලබා දී තිබේ. ඒ අනුව 1962 දී රාජ්‍ය ලේඛනාගාර දෙපාර්තමේන්තුව විසින් "Ceylon National Bibliography" (ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය) ආරම්භ කොට තිබේ. 1970 අංක 17 දරන ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩල පනතට අනුව මෙම ග්‍රන්ථ නාමාවලිය සැකසීමේ කටයුතු එම මණ්ඩලයට පැවරී තිබේ. ඩෙන්මාර්කය වැනි රටවල ග්‍රන්ථ නාමාවලිය පළ කිරීම පුද්ගලික ආයතනවලට පැවරී තිබුණ ද ලෝකයේ බොහෝ රටවල එම කාර්යය ජාතික කර්තව්‍යයක් ලෙස සලකා රාජ්‍ය ආයතනවලින් සිදු කරනු ලැබේ. එහි දී ජාතික පුස්තකාල, ජාතික කෞතුකාගාර, ජාතික ලේඛනාගාර හා විශ්වවිද්‍යාල, මූලිකත්වයක් ගෙන කටයුතු කරන බව දැකිය හැක. ශ්‍රී ලංකාවේ මෙම කාර්යය රාජ්‍ය ලේඛනාගාරයෙන් ආරම්භය සිදුකොට දැනට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලැබේ. එබැවින් මේ සඳහා ජාත්‍යන්තර ව මැදිහත් වී ඇති සංවිධාන අතරින් යුනෙස්කෝ ඉෆ්ලා යන ආයතන ප්‍රධානත්වයක් ගෙන තිබේ. 1976 ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය ස්ථාවර අයුරින් පිහිටුවා ඇති අතර අප රටේ ජාතික පුස්තකාලයක් ආරම්භ කිරීමේ ප්‍රධාන ම කාර්යය එම මණ්ඩලයට අයිති විය. එසේ ම ග්‍රන්ථ විඥාපන පාලනයට අදාළ කාර්යය ද මෙම මණ්ඩලයට පැවරුණි.

ඒ අනුව ලංකාවේ ජාතික වශයෙන් වැදගත් වූ ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය 1990 අප්‍රේල් 27

දින විවෘත කරනු ලැබුවද ජාතික පුස්තකාලයකින් සිදුවිය යුතු සමහර කාර්යාවලින් (1870) කොළඹ රජයේ ප්‍රාචීන පුස්තකාලය මගින් ආරම්භයේ සිට ම ඉටු වී ඇත.

**ශ්‍රී ලංකාවේ ග්‍රන්ථ විඥාපන පාලනය**

1998 අංක 51 දරන පනතට අනුව ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය බවටත් පුස්තකාල සේවා මණ්ඩලය ප්‍රලේඛන සේවා මණ්ඩලය වශයෙනුත් වෙනස් විය. ඒ අනුව අද ප්‍රකාශන හිමිකම යටතේ ශ්‍රී ලංකාව තුළ පළවන ප්‍රකාශනයකින් පිටපත් 05ක් ජාතික ලේඛනාගාර දෙපාර්තමේන්තුවට ලැබුණ ද ඉන් එක් පිටපතක් 1976 සිට ඉහත කී මණ්ඩලය වෙතට යවනු ලැබේ. ඉතිරි පිටපත් 4 න් දෙකක් ම ලේඛනාගාරයේ තැන්පත් කරනු ලබන අතර අනෙක් පිටපත් දෙක ජාතික කෞතුකාගාරයට හා පේරාදෙණිය විශ්වවිද්‍යාලය වෙත යැවේ. මෙය ද ග්‍රන්ථ විඥාපන පාලනයේ දී ඉතා වැදගත් කාර්යයකි. මේ ආකාරයට 1976 සිට ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය ද ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් සම්පාදනය කරනු ලැබේ. මෙය ආරම්භයේ දී ජාතික ලේඛනාගාරය විසින් මාසික ව පළ කළ ද පසුව එය වාර්ෂික වශයෙන් පළකොට තිබේ. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය ද මෙය ඉහත ආකාරයෙන් පළ කිරීමේ කටයුතු අඛණ්ඩ ව කරගෙන ආවත් 1990 පසු මේ දක්වා මාසික ව පළ කරන බව පෙනේ. මෙයට අතිරේක ව පහත සඳහන් ආකාරයෙන් ප්‍රකාශන හා දත්ත පදනම් සැකසීමෙන් ශ්‍රී ලංකාවේ ග්‍රන්ථ විඥාපන පාලනය සඳහා වැදගත් මෙහෙවරක් සිදු කරනු ලැබේ.

I. ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය 1974 සිට (කාලීනව)
II. ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය සමුච්ත
III. ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය (පූර්ව කාලීන 1737 - 1930 දක්වා)
IV. ශ්‍රී ලංකා සමුළු හා සම්මේලන අනුක්‍රමණිකාව (1976 -1995)
V. ස්ථාන පිළිබඳ ග්‍රන්ථ නාමාවලිය - (1994 කතරගම)
VI. SAARC සංවිධානය සම්බන්ධ ග්‍රන්ථ නාමාවලිය (1991)
VII. ළමා ග්‍රන්ථ නාමාවලිය 1988 සිට
VIII. රජයේ ප්‍රකාශන නාමාවලිය 1990- 1997, 2005, 2006
IX. දිස්ත්‍රික් පුස්තකාල සමීක්ෂණ 1990
X. ශ්‍රී ලංකාවේ අධ්‍යාපනික. වාර්තා පිළිබඳ පළ කරන ලද ග්‍රන්ථ නාමාවලිය (සෞම්‍යා කෝදාගොඩ මිය)
XI. ශ්‍රී ලංකා පුස්තකාල නාමාවලිය 1994
XII. පුවත්පත් ලිපි අනුක්‍රමණිකාව සිංහල දෙමළ ඉංග්‍රීසි 1903- 1994
XIII. ශ්‍රී ලංකා වාර සඟරා ලිපි අනුක්‍රමණිකාව සිංහල, දෙමළ, ඉංග්‍රීසි 1998 සිට
XIV. ශ්‍රී ලංකා පරිවර්තන සාහිත්‍ය ග්‍රන්ථ නාමාවලිය 1947- 1999
XVII. ජාතික ඒකාබද්ධ සූචිය I, II, III
XVIII. Computerized National Union Catalogue part 1, II and III
XIX. Directories of Libraries in Sri Lanka – 1994,2010
XX. Sri Lanka (ISBN) publisher's Directory – 1987, 1991,1999
XXI. Directories in Social Scientist in Sri Lanka – part I and II
XXII. University of peradeniya Library Sri Lanka Collection Vol. I and II
XXIII. Index to Postgraduate Theses, 2001-2006
XXIV. Index to Research Reports in Sri Lanka, 2005-2009

ඒකාබද්ධ සූචිය තුළින් ලංකාවේ පුස්තකාල 90ක පමණ සමාජ විද්‍යා පොත් පිළිබඳ විස්තර ආදිය අන්තර්ගත ය. මේවා සියල්ල අන්තර්ජාතික ග්‍රන්ථ විස්තරවලට (ISBD), අනුව සකස්කර ඇති හෙයින් ග්‍රන්ථවිඥාපන පාලනය පහසු කරයි. ISBN, ISSN, ISMN වැනි ජාත්‍යන්තර අංකන ලබාදීම තුළින් ද

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයෙන් සිදුකරන විඥාපන පාලන කාර්යයන් අතර ප්‍රධාන වේ.

එසේම ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව විසින් 1971 දි ආරම්භ කර ඇති (Periodical Directory) යන ප්‍රකාශනයේ පැරණි වාරසඟරා ලිපි හෙවත් පූර්ව කාලීන සඟරා තොරතුරු අඩංගු කොට කොටස් තුනකින් සමන්විත මූලාශ්‍රයක් සකස්කර තිබේ. එහෙත් එය නිරන්තරයෙන් පළ නො වේ.

1. Sri Lanka Scientific and Technical Periodical Directory – 1976 (National Science Foundation)

2. (එම් එස් සුල්තාන්) List of Scientific Periodicals in the Libraries of Ceylon – 1953

3. A Union List of Scientific Periodicals in Ceylon (compiled by M A P Senadheera)– National Science Council – 1971

4. Bibliography of Bibliographies by H.A.I. Gunatilaka

5. Union list of Scientific and Technical Periodicals in Sri Lanka – National Science Council – 1980

6. UNICAST – Union Catalogue of Scientific and Technical Books, 1983-87

07. UNICEB – Union Catalogue of Enviornment Books, 1994-95

යනාදි සමහර ප්‍රකාශන ද අදාළ වර්ෂයෙන් පසු නිරන්තර ව පළකොට නැති බව පෙනේ. කෙසේ වෙතත් වර්තමානයේ දී තොරතුරු තාක්ෂණය හා විඥාපන පාලන කටයුතු සම්බන්ධයෙන් සාර්ක් කලාපයේ ඉන්දියාව ඉදිරියෙන් සිටිය ද අනෙක් රටවල් හා සැසදීමේ දී ශ්‍රී ලංකාව සැලකිය යුතු ජයග්‍රහණ අත්පත් කරගෙන ඇත.

**අනාගත අභියෝග**

ශ්‍රී ලංකාවේ ග්‍රන්ථ විඥාපන පාලන කාර්යයන් 1990 දශකය දක්වා ම සිදුවී ඇත්තේ මානව හා භෞතික සම්පත් ආධාරයෙනි. එහෙත් 21 වන සියවස උදාවීමත් සමග ම පරිගණකය ද වේගයෙන් පුස්තකාල කටයුතු කෙරෙහි භාවිතයට ගැනීමට ලෝකයේ බොහෝ රටවල් උත්සුක වී ඇති බැවින්, ශ්‍රී ලංකාව ද පරිගණක භාවිතයෙන් පුස්තකාල කටයුතු සිදුකිරීම ආරම්භ කර ඇත. එහෙත් මෙහි දී තොරතුරු අත්පත් කර ගැනීමේ දී ශ්‍රී ලංකාවේ පවතින නෛතික පරිසරය සීමාසහිත වී තිබීම ගැටලු සහගත ය. 1885 අංක 01 දරන මුද්‍රණ කරුවන්ගේ හා ප්‍රකාශකයින්ගේ නීතියට අනුව මුද්‍රිත ප්‍රකාශනවල පිටපත් 5 පමණක් ජාතික ලේඛනාගාරය වෙත ලැබෙන අතර ඉන් ජාතික පුස්තකාලයට ලැබෙන පිටපත පිළිබඳ තොරතුරු ජාතික ග්‍රන්ථ නාමාවලියට ඇතුළත් වේ.

එහෙත් ශ්‍රී ලංකාව තුළ දිනෙන් දින බිහිවන ශ්‍රව්‍ය දෘශ්‍ය, (චිත්‍රපට. සංගීත තැටි වීඩියෝ තැටි) හා CD වර්ග මේ සඳහා අත්කර ගැනීමට අදාළ නීති රීති හා පරිසරය සැකසීම අනාගතයේ ජයගත යුතු අභියෝගයන් ය. තව ද අද අන්තර්ජාලය (Internet) තුළින් විශාල වශයෙන් තොරතුරු බිහිවෙති. (E-publication) නමුත් මේවා සඳහා ග්‍රන්ථ විඥාපන පාලනයක් සිදුකිරිම ගැටලු සහගත ය. මේ වෙනුවෙන් අන්තර්ජාතික ව පිළිගත් ප්‍රමිති ද නොමැති අතර එහි ඇති තොරතුරු මොහොතින් මොහොත වෙනස්වන සුළු වේ. එබැවින් අන්තර්ජාලයට හිමිකරුවකු නො මැති නමුත් මෙම තොරතුරු උපයෝජක ජනතාවට ලබාදීමට නම් සෑම රටක ම ඉතා වේගයෙන් ක්‍රියාත්මක වන පරිගණක ජාල පද්ධතියක් තිබීම වැදගත් ය. එසේ ම ඒ ඒ රටවලට ආවේණික හා වැදගත් යැයි සැලකෙන වෙබ් පිටු (Web pages) රැස්කර ගැනීම සඳහා යම් ක්‍රමවේදයක් අන්තර්ජාල නිර්මාණය කරන ආයතන හා සමාගම් එක් ව කළ යුතු වේ. එහෙත් මේවා පරිශීලනය සඳහා අන්තර්ජාල පහසුකම්

ඇත්නම් ලෝකයේ බිහිවන තොරතුරු ඉතා ඉක්මනින් උපයෝජකයා හට ලබා ගැනීමට හැකියාව පවතී. ශ්‍රී ලංකාවේ දැනට මේ සම්බන්ධයෙන් කල්පනා කොට **"නැණසල"** සහ **"විදාතා"** වැනි මධ්‍යස්ථාන ආරම්භ කොට තිබුණත් ඒවා බොහෝමයක ම අන්තර්ජාල පහසුකම් නො මැති වීම හා නිසියාකාර පාලනයක්, නඩත්තුවක් නො මැතිවීම දක්නට ඇති ප්‍රධාන ලක්ෂණයන් ය. එබැවින්, ලංකාවේ සමහර පුස්තකාලවල පරිගණක භාවිත වුව ද ඒවායේ සිදු කරන්නේ බොහෝවිට මුද්‍රිත සූචිය ඒ ආකාරයෙන් ම පරිගණක සූචියට හැරවීමයි. මෙය OPAC ලෙස තිබුණත් වර්තමානයේ උපයෝජකයන් ඒවා භාවිතයට අලස බවක් දක්වන බව පෙනේ. එබැවින් පරිගණක සූචිය සඳහා වඩාත් පුළුල් ආකාරයෙන් ග්‍රන්ථ විස්තර ප්‍රවේශගත කිරීම අනාගතයේ දී ජයගැනීමට ඇති අභියෝගයන් ය. මීට අමතර ව පහත පියවර අනුගමනය කිරීම හරහා ග්‍රන්ථ විඥාපන පාලන සංකල්පය ප්‍රායෝගික තත්වයට පත්කරගත හැකි ය.

- ජාතික ග්‍රන්ථ නාමාවලිය නිසි වේලාවට කාලානුරූප ව ප්‍රකාශයට පත් කිරීම
- ජාතික ඒකාබද්ධ සූචිය සඳහා තොරතුරු ඉතා ඉක්මනින් ලබාගැනීම
- ජාතික ග්‍රන්ථ නාමාවලිය වැනි ග්‍රන්ථ විඥාපන මෙවලම් පුස්තකාලවලට ලබාගැනීම සඳහා, මූල්‍ය ප්‍රතිපාදන වෙන්කරවා ගැනීම
- ග්‍රන්ථ විඥාපන පාලනය සඳහා රාජ්‍ය අනුග්‍රහය ලැබීම සම්බන්ධයෙන් එහි වැදගත්කම රජයට අවබෝධ කරවීම
- ශ්‍රව්‍ය දෘශ්‍ය පරිගණක මෘදුකාංග අත්පත් කර ගැනීමට දැනට ඇති ගැටලු මඟහරවා ගැනීම
- විඥාපන පාලන ආයතනවලින් තොරතුරු බෙදා හැරීම සඳහා දැනට ගෙන ඇති පියවර ප්‍රවර්ධනය කිරීම
- විඥාපන පාලනය සඳහා තාක්ෂණය යොදා ගැනීම
- එකම මෘදුකාංගයක් පුස්තකාල අතර භාවිත කිරීම

තවද නීතිමය තැන්පතුව සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීමට අදාළ පාර්ශවයන් මනාව දැනුවත් නො වීම හා දැනට ඇති නීති සංශෝධනය කිරීම යනාදිය අනාගත අභියෝග ලෙස හැඳින්විය හැකි ය. එසේ ම මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව තුළ සිටින විද්වතුන්ගේ අවධානය ද ඉදිරියේදී මීට වඩා යොමුවීම ගැන සිතා බැලීම වටී.

ග්‍රන්ථ විඥාපන පාලනය සඳහා නාමාවලී අනුක්‍රමණිකා, සාරසංග්‍රහ, ජාතික ඒකාබද්ධ සූචි, ඒකාබද්ධ ලැයිස්තු, ප්‍රතිග්‍රහණ ලැයිස්තු හා පරිගණක ග්‍රන්ථ විඥාපන දත්ත පදනම් ආදිය මුද්‍රිත මාධ්‍යයෙන් මෙන් ම විද්‍යුත් මාධ්‍යයෙන් ද ආරම්භ කළ හැකි වුවත් නිරන්තරයෙන් පවත්වාගෙන යාමේ දී ගැටලු මතුවේ. මෙම කාර්යයන් බොහෝමයක් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය විසින් සිදු කරනු ලැබුව ද අඛණ්ඩ ව පවත්වාගෙන යාමට අපහසු වී ඇත්තේ වෘත්තීය කාර්ය මණ්ඩල හා මූල්‍ය ප්‍රතිපාදන සීමාවීම වැනි සාධකවල බලපෑමෙනි, එසේ ම

- ප්‍රවර්තන සම්ප්‍රජානන සේවය (Current Awareness Services)
- නව ප්‍රතිග්‍රහණ ලැයිස්තු සැකසීම (New Acquisition Lists)
- පටුන පිටු සේවය (Content Pages Services)
- ඒකාබද්ධ සඟරා ලැයිස්තු (Union List of Periodicals)
- වාරසඟරා නාමාවලි
- වාරසඟරා ලිපි අනුක්‍රමණිකා සැකසීම
- පුස්තකාල සඳහා පරිගණක ජාල (Computer Networks) සැකසීම වැනි ක්‍රියාමාර්ග හරහා ග්‍රන්ථවිඥාපන පාලනය සිදු වේ.
- ජාතික චිත්‍රපට සංස්ථාවේ ඇති චිත්‍රපට ලැයිස්තු හා අන්තර්ගත ලේඛන
- රූපවාහිනී හා ගුවන්විදුලි මධ්‍යස්ථානවල ඇති ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය ලැයිස්තු හා ලේඛන

- ජාතික ලේඛනාගාරය හා කෞතුකාගාරය වැනි ආයතනවල ඇති සූක්ෂම රූපන ද්‍රව්‍ය (Micro Forms) අඩංගු ලේඛන හා මූලාශ්‍රයන් මැනවින් පාලනය වීම සඳහා ජාතික වශයෙන් විත් ප්‍රතිපත්තියක අවශ්‍යතාව මතු වී ඇත.

- ජාල(Networks) තොරතුරු පාලනය සඳහා කටයුතු කරන ක්‍රියාකාරී පද්ධතියකි.SLSTIC- Development Periodcles in Sri Lanka Libraries, NIE -1999. (මෙහි අධ්‍යාපන විෂයයට අදාළ ප්‍රමුඛ පෙළේ පුස්තකාල 32ක් විසින් මිල දී ගනු ලබන වාරික ප්‍රකාශන පිළිබඳ තොරතුරු ඇතුළත් ඒකාබද්ධ සඟරා ලැයිස්තුවකි)

- HELLIS, AGRINET, NEINET යන දේශීය වශයෙන් පවතින ජාල සහ (DEVINSA/ CINSA) යන කලාපීය වශයෙන් ඇති ජාල තුළින් ද සිදුවන්නේ තොරතුරු පාලනයකි

- ජාලගත සූචි (Web Catalogues) සහ ජාලගත ග්‍රන්ථ නාමාවලි (Web Bibliographies) ආධාරයෙන් විඥාපන පාලනය සිදු කිරීම නුදුරු අනාගතයේ දී සිදුවිය හැකි ය. දැනට ජාතික විද්‍යා පදනම (NSF) මගින් ආරම්භ කර ඇති Purna Union Catalogue එහි මූලික අවස්ථාවකි. (Yapa.2008,01-16)

කෙසේ වෙතත් ශ්‍රී ලංකාවේ ග්‍රන්ථ විඥාපන පාලනය සඳහා දැනට ඇති නීතිරීති ප්‍රමාණවත් නොවේ. මන්ද නීත්‍යනුකූල තැන්පතුව සම්බන්ධයෙන් 1839 අංක 5 දරණ ප්‍රවෘත්ති පත්‍ර ආඥා පනත 1951 අංක 18 මගින් සංශෝධනය වී ඇත. එසේ ම 1885 ප්‍රකාශන හා මුද්‍රණකරුවන්ගේ ආඥා පනත ද 1948, 1951 1976 සහ 1983 යන වසරවල දී සංශෝධනය වී තිබේ. (හේමපාල 1996) එහෙත් ඉන්පසු මේ වනතුරු වෙනසකට බඳුන් වී නො මැත. 1902 අංක 16 දරණ මුද්‍රණාල පනත ද සංශෝධනය වී ඇතත් මේ සම්බන්ධයෙන් සර්ව සම්පූර්ණ නීති ක්‍රමයක් ලංකාවට නො මැති වීම ගැටලුවකි. විශේෂයෙන් ම අද වන විට Micro Forms, Audio and Video, E-publication සහ Multimedia Kits ආදිය සඳහා ඇති විඥාපන පාලන ක්‍රමවේදයන් ප්‍රමාණවත් නො මැති බව පෙනේ.

ජාතික ග්‍රන්ථ නාමාවලිය පමණක් නොව විඥාපන පාලන මූලාශ්‍ර බොහෝමයක් ම විද්‍යුත් මාධ්‍ය මගින් ප්‍රකාශයට පත් කිරීම යුගයේ අවශ්‍යතාවක් වුව ද ශ්‍රී ලංකාවේ පුස්තකාල රාශියක් පරිගණක භාවිත නො කිරීමත් සහ අදාළ ගබඩා පහසුකම් වැනි යටිතල පහසුකම් ප්‍රමාණවත් නො වීම හේතුවෙන් මුද්‍රිත ප්‍රකාශන වශයෙන් ම තව දුරටත් ප්‍රකාශයට පත් කිරීම යෝග්‍ය යැයි සිතේ. කෙසේ වෙතත් 1998 දී කෝපන්හේගන් නුවර දී පවත්වන ලද ඉෆ්ලා ආයතනයෙන් විශ්ව ග්‍රන්ථ විඥාපන පාලනය හා අන්තර්ජාතික මාර්ක් වැඩසටහන (MARC Core programme)ට අනුව කටයුතු කිරීමට ලෝකයේ ජාතික පුස්තකාල එකඟ වුව ද රටවල පවත්නා ප්‍රායෝගික තත්වයන් මත කටයුතු කිරීමට සිදු වේ. එබැවින් ශ්‍රී ලංකාවේ ග්‍රන්ථ විඥාපන පාලනය ජාතික වශයෙන් ඉතා වැදගත් සේ සළකා කටයුතු කළහොත් අනාගත අභියෝග බොහෝමයක් ජයගත හැකි ය. කෙසේ වෙතත් ශ්‍රී ලංකාවේ ග්‍රන්ථ විඥාපන පාලනය සම්බන්ධයෙන් මේ දක්වා ගෙන ඇති පියවරයන් ගැන ආසියාවේ අනෙකුත් රටවල් හා සැසඳීමේ දී ශ්‍රී ලංකාව ද තරමක් ඉදිරියෙන් සිටින බවක් පෙනේ. එසේ ම පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයේ වෘත්තිකයන්, විද්‍යාර්ථීන් පමණක් නො ව උපයෝජකයන්, රජය හා මහජනතාව ද මේ සම්බන්ධ ව මනා කොට දැනුවත් කිරීමෙන් අනාගතයේ යහපත් විඥාපන පාලනයක් ඇති කර ගත හැකි වනු ඇත.

**ආශ්‍රිත විමර්ශන**

01. අමරසිරි, උපාලි (1992) : නීතිමය තැන්පතු ක්‍රමය පිළිබඳ හැඳින්වීමක්. ***පුස්තකාල ප්‍රවෘත්ති.*** 13. (1). 27-31. කොළඹ. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය.

02. අමරසිරි, උපාලි (සංස්), (1990) : ***ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සමරු කලාපය.*** ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය.

03. අමරවීර, ජේ. ඒ. (2007) : ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ ප්‍රතිපත්ති සහ සාධිකාරී ලේඛන ව්‍යාපෘතිය. ***සම්මන්ත්‍රණ පත්‍රිකාවකි.*** ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය.

04. ද සිල්වා, නාලිනි (1993) : ජාතික විඥාපන පාලනය හා ශ්‍රී ලංකාව පිළිබඳ සංසන්දනාත්මක විග්‍රහයක්. ***පුස්තකාල ප්‍රවෘත්ති.*** 14. (01). 9-13. කොළඹ. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය.

05. පුනාවර්ධන, ඩබ්. එස්. (1992), පූර්වකාලීන ජාතික ග්‍රන්ථ නාමාවලිය : ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ වත්මන් ව්‍යාපෘතිය හා එය සම්පාදනයේ දී මුහුණ දෙන දුෂ්කරතා. **පුස්තකාල ප්‍රවෘත්ති.** 13. (3). 3-7. කොළඹ: ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය.

06. ප්‍රනාන්දු, ජානකි. (2000), ශ්‍රී ලංකාවේ වාරසඟරා, පුවත්පත් සම්මන්ත්‍රණ පත්‍රිකා සහ රජයේ ප්‍රකාශන පිළිබඳ ග්‍රන්ථ විඥාපන පාලනය. ***පුස්තකාල ප්‍රවෘත්ති.*** 21. (2). 9-16. කොළඹ. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය.

07. රණසිංහ, පියදාස. (1993), මුද්‍රණ කරුවන්ගේ හා ප්‍රකාශකයන්ගේ ආඥාපනත හා ලංකාවේ මුද්‍රිත පොත් පිළිබඳ ප්‍රකාශනය. ***පුස්තකාල ප්‍රවෘත්ති.*** 16. (2). 6-9. කොළඹ. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය.

08. ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලි සම්පාදන ප්‍රතිපත්ති, (2001), ***පුස්තකාල ප්‍රවෘත්ති.*** 22. (3). 8-9. කොළඹ. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය.

09. හේමපාල, නුවරඑළියේ. (1996), ශ්‍රී ලංකාවේ නීතිමය තැන්පතු නීතිය. ***පුස්තකාල ප්‍රවෘත්ති.*** 17. (1). 16-17. කොළඹ. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය.

10. Lankage, Jayasiri (2007). Retrospecitve National Bibliography project : and Evaluation, ***Seminar paper*** Colombo. NLDSB.

11. Marcelle, Beandqnez (1982). Bibliographical Services Through the world supplement. Paris.UNESCO.

12. Pemberton, John. E (1982). The Bibliographic Control of official publication. Oxford. Pergamon press.

13. Ranasingha, Piyadasa (2008). Retrospective National Bibliography : a theoretical analysis. ***Sri Lanka Library Review***. Colombo. Sri Lanka Library Association.

14. Yapa, N.U.(2008) Computerization of Union Catalogues : With Special reference to Sri Lanka, ***Sri Lanka Library Review***, 22 (01-16). Colombo Sri Lanka Library Association.

## ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

**සේවාවන්** : විමර්ශන, ලේඛන සැපයීම්, අන්තර් පුස්තකාල පිරුළු සේවා, ග්‍රන්ථ විඥාපන සේවාව, ජාතික ඒකාබද්ධ සූචිය, යොමුගත සේවාව, ප්‍රතිරූපන සේවා, අන්තර්ජාල පහසුකම්,

**එකතුන්** :

- විමර්ශන ග්‍රන්ථ - විශ්වකෝෂ, ශබ්ද කෝෂ, වාර්ෂික ග්‍රන්ථ
- සිතියම් එකතුව
- දුර්ලභ කෘති එකතුව
- පුවත්පත් (1976 වසරේ සිට) සිංහල, දෙමළ, ඉංග්‍රීසි (දේශීය පුවත්පත් පමණි)
- වාර සඟරා - දේශීය සහ විදේශීය
- ජාතික සහ අන්තර්ජාතික ප්‍රවෘත්ති සඟරා
- විද්‍යා හා තාක්ෂණික ග්‍රන්ථ එකතුව
- යුනෙස්කෝ පොත් එකතුව
- පැරණි පුස්කොළ පොත් එකතුව
- ශ්‍රී ලංකා එකතුව
- විද්‍යුත් මාධ්‍ය එකතුව
- ශ්‍රව්‍ය දෘශ්‍ය එකතුව
- රජයේ ප්‍රකාශන එකතුව
- පුස්තකාල හා විඥාපන විද්‍යා එකතුව
- නිබන්ධන එකතුව
- ජනශ්‍රැති එකතුව
- නීත්‍යානුකූල තැන්පතු එකතුව

ජාතික පුස්තකාලයේ පාඨක සේවා අංශය සඳුදා සිට සෙනසුරාදා දක්වා විවෘතව පවතී.

**විවෘතව තබන වේලාවන්**

සඳුදා, බදාදා, සිකුරාදා සහ සෙනසුරාදා දිනවල පෙ.ව.8.30 සිට ප.ව. 4.15 දක්වා අඟහරුවාදා සහ බ්‍රහස්පතින්දා දිනවල පෙ.ව.8.30 සිට ප. ව. 6.15 දක්වා

**සාමාජික ගාස්තු**

| | | |
|---|---|---|
| දිනකට | : | රු. 20.00 |
| මාස 03 කට | : | රු. 100.00 |
| අවුරුදු 01 කට | : | රු. 350.00 |
| යාවජීව සාමාජිකත්වය | : | රු. 1000.00 |
| ආයතනික සාමාජිකත්වය(වසරක් සඳහා) | : | රු. 2500.00 |

**විස්තර සඳහා**

අංශ ප්‍රධාන
පාඨක සේවා අංශය
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය
අංක 14 නිදහස් මාවත
කොළඹ 07
දුරකථන අංක : 011-2674386 011-2685197
ෆැක්ස් : 011-2685201
වෙබ් අඩවිය : http://www.natlib.lk
ඊ මේල් : reder@mail.natlib.lk

# National Library : The Symbol of National Unity

**By Nalini Mallawa Arachchi**
**Director - NLDSB**

## Introduction

Development of a Nation's knowledge is considered as a matter of utmost importance in the development process of a nation. National Libraries have to play a leadership role in their respective countries while they promote information services by contributing to the knowledged society. It is suitable to identify the National Library as a symbol of national unity in any country.

Sri Lanka National Library Services Board was established in 1970 under the Act No.17. One of the main responsibilities of the Board was the establishment of the National Library of Sri Lanka. The Board played an important role during the period 1970-1990 to achieve this objective. National Library of Sri Lanka was opened on 27th April 1990. The amended Act No51 of 1998 has made a significant impact on its services. The name of the Board was changed as (National Library and Documentation Services Board) which is more appropriate as far as its services are concerned. According to this Act, the responsibilities and functions of the National Library have been expanded with particular emphasis on development of the country by enhancing national unity based on current social needs of the country.

## Library Collections

Sri Lanka is a multi- national, multi-religious and multi-lingual country with a very high literacy rate. The highest needs, aspirations, intellectual and spiritual development of the people must be identified by the National Library and try to fulfill them. Also the NL should serve the people to achieve material progress and aesthetic fulfillment, cultural and literary heritage of the people. The National Library has a comprehensive collection of library materials relating to Sri Lanka and many other information sources in the form of print, audio-visual and electronic media. However, majority of the library resources are in Sinhala and English medium. In relation to resources development of the National Library the. mechanism of acquiring materials is based on the legal deposit scheme, purchases, donations and exchanges. It is a legal requirement that a copy of every Sri Lankan publication should be deposited in the National Library in terms of the printers and publisher's ordinance of 1885 as amended in 1976. National Library collection consists of material in all three languages (Sinhala, Tamil, English). These collections can be used to all Sri Lankans including Tamil speaking community. National unity can be strengthened by collecting library materials in this manner.

The National Library maintains number of collections which highly reflects its objectives and bridges the gap of information needs of the nation. It consists of number of collections namely legal deposit, publications on Sri Lanka, thesis, newspapers, periodicals, reference sources, palm-leaf materials, maps, government publications etc.

## Services

Being the premier library in the country, the NL provides comprehensive and up to date library services to the entire country. Any citizen living in any part of the country can obtain these services which are listed as follows:

- Reader Services
- Bibliographic Services
- Documentation Services
- Conservation & Preservation Services

- Advisory Services
- IT & Digital Services
- Library Grading Book Donations for libraries
- Reading Promotion activities Providing of Publication Assistance

These services are providing by different sections namely Acquisition, Reader services, Bibliography, Conservation and preservation, Library Development, Book Development, IT and Digital Section etc. Among the above mentioned services, the reader services division of the National Library is considered the hub of the institution which facilitates the use of resources of the library. The main task of this section is to render library and information resources to all Sri Lankan communities assisting them to achieve intellectual advancement. The National Library is open to the public from Monday to Saturday and all Sri Lankans are eligible to use the library resources. Photocopies and internet facilities are provided at a concessionary rate. At the same time, people are benefited from the other services such as Information re-packaging, document delivery, user education, SDI, Current Awareness Service etc. The three reading rooms of the library provide facilities for 320 readers. The main information desk placed on the ground floor guides users to the appropriate service point after making registration. Photocopies and internet facilities are provided at a concessionary rate. Further, there is an inter-library lending scheme for issuing library materials for the other libraries in the country.

Information and the details of services relevant to the National Library can be searched through our website www.natlib.lk. Moreover, there are several online databases for the benefit of researches and academic communities.

- Devolution of power and ethnic conflict
- Index to Postgraduate Theses
- Newspaper Article Index
- Directory of Public Libraries in Sri Lanka
- National Union Catalogue (UCAT)
- Local Catalogue (National Library Catalogue)

## National Bibliographic Services

One of the objectives of a National Library is to ensure an orderly bibliographic control of all Sri Lankan publications. Compilation of the Sri Lanka National Bibliography is a successful project. Being a multi-lingual country, publications in Sinhala, Tamil and English are included in the Sri Lanka National Bibliography. It is a useful instrument for researcher's librarians and general public who are searching latest publications in Sri Lanka in three languages. Thus, National Library compiles current bibliography, the retrospective and annual cumulative volumes appeared which are in three languages. In addition to that, the following publications cover information in all three languages

- Children's Bibliography (1988-1995)
- Sri Lanka Periodical Article Index (Quarterly ) (since 1998 – 2010)
- Sri Lanka Newspaper Article Index (Now it is maintained as a online database)
- Author Authority files (Sinhala / Tamil)
- Library News (NLDSB Newsletter)

## Publication Assistance Project

The National Library maintains number of projects for the improvement of book development sector in the country. Publication Assistance Project maintained by NLDSB assists writers of all communities in Sri Lanka (Sinhala/ Tamil/ Muslim/ Burgher/ Malay). Authors are provided financial assistance to publish their books under this project. More than 100 authors are benefited per year by publishing their works. Considerable amount

178030

of Tamil books have also published by Tamil authors in various parts of the Island. However, there is not sufficient number of Tamil works due to lack of Tamil manuscripts. Other arrivals in Tamil medium are also collected annually. Thus National unity is improved by providing Tamil books for the Tamil speaking community. Therefore, the National Library has given special attention to supply necessary grants for this valuable project. Accordingly, under book purchasing project too writers of all communities are received assistance from the NLDSB. It also helps to empower knowledgable multi-lingual society by promoting reading habits of the people.

## Book Donations for Libraries

NLDSB assists all communities to develop their libraries. A large amount of books were donated to North, East and Central provinces where the majority population is Tamil. During the period of 2008- 2010, Rs. 18.5 million worth of Tamil books were donated to 175 libraries. In addition, books received from 'Book Aid International' project were used to assist libraries in Northern/ Eastern and Central Provinces. NLDSB played an important role in the 'Reconstruction of Jaffna Public Library' by helping in various ways. NL provided a large collection of books along with the other books collected from donors.

## Rehabilitation activities (Tsunami)

Soon after the Tsunami disaster, the NLDSB appealed to UNESCO and international and national library communities for assistance in rebuilding the Tsunami affected libraries in Sri Lanka. NLDSB created a link through its web page named Tsunami affected libraries is Sri Lanka; Damages; reconstructions; soon after the Tsunami that lashed the coastal belt of Sri Lanka on 26th December 2004. A team of inspectors from the NLDSB undertook an inspection tour in the Southern, Northern and Eastern provinces. In addition, NLDSB, set up a Library Disaster Management Committee to co-ordinate the rehabilitation and reconstruction activities of the libraries affected by Tsunami tidal waves. This committee consists of 13 members headed by the Chairman and the Director General of the NLDSB. Ten task forces were appointed by making groups such as interim relief, library buildings, school libraries, public libraries, conservation, and library plans etc.

Information for All Programme (IFAP) of UNESCO has granted US $ 100,000,00 for immediate urgent needs for the development of public libraries in Sri Lanka affected by Tsunami. Funds donated by different organizations for the rebuilding effort were used for:

- repairs of library buildings
- renting of temporary buildings
- donation of books and library materials
- donation of library furniture and equipment
- advisory services and library building plans
- IT Corners with Internet facilities
- staff training

Three seminars conducted under the theme: "Tsunami affected libraries in Sri Lanka: What next? - rebuilding the Tsunami affected school libraries, public libraries selection of library materials for damaged libraries. It encouraged all ethnic groups to work together for the development of damaged libraries. Another programme 'Tsunami Children's Book Project' was launched to publish fifteen children's books (Seven in Sinhala, five in Tamil and three in English) with the objective to produce high quality children's books on themes such as courage, determination and overcoming life's obstacles.

Information was collected to identify the damages caused to libraries by Tsunami.

A database containing information on the damaged libraries was also maintained. A photo album of the libraries destroyed by the Tsunami entitled "Rehabilitation of Tsunami affected libraries" was exhibited at the 71st IFLA conference held in Oslo, Norway.

## Library grading project

Grading of libraries is an important service rendered by NLDSB. So far, it has been graded 66 libraries located in Northern and Eastern provinces. This process was not properly functioned because of war situation within last 3 decades. NL has formulated library standards of public, school and departmental libraries in Sri Lanka. All the documents relevant to the standards are available in print format in Tamil medium as well as Sinhala and English. These documents can be downloaded through the NLDSB website (www.natlib.lk). It enables national unity to some extent.

## Training programmes

One of the main functions of the NL is to provide learning opportunities to every Sri Lankan and assist them to enhance intellectual performances. NLDSB organizes seminars and workshops covering different subject matters such as Library Management, Documentation Services, Bibliographic Control, Conservation/Preservation and ICT Training, etc. in collaboration with the governmental institutions, provincial councils and other professional bodies in three languages. NLDSB organizes training programmes for library sector in provincial level. In early days, annual seminars and training programmes were conducted in Northern and Eastern provinces in Tamil medium. The war situation disrupted the programmes to certain extent. However several training workshops were held for librarians and library assistants of the public libraries in the Northern and Eastern provinces for last years. National Library intends to revive many training programmes for the North and East in the near future.

In service training in Tamil medium was also provided to students of the SLLA. It was given an opportunity for Tamil students on how to work at the different divisions of the National Library with practical experiences. Further, facilities are given to the National Library staff to follow Tamil Language Courses conducted by the Department of Official Languages. These training programmes are helpful to cultivate the national unity.

## Provincial Council Library Project

The NLDSB started the PCLP in early 1990 s with a view to decentralize the library services at provincial level. This is an excellent move to empower local authorities and provincial councils to have their own library system. This project is important because it has possibility to plan proper library services for the people of relevant administrative area based on information needs of them. On the other hand, another important features can be identified. These are creating a provincial Library Services Board to each province in the country, enactment of library legislation at provincial level by each provincial council and setting up, a provincial central library in each province etc. This project was successful due to continuous guidance of the National Library. One of the activities planned in this connection is making a provincial library charter for each province. The library charter of the Central provincial has been approved by the Governor in 1996. At present there are two Provincial Library Services Boards are functioning namely Central, and Uva provinces. They have separate new buildings and other facilities such as furniture, equipments with library staff. Two Library Services Boards (Central and Uva) provide services under the execution of the Chairman and the panel of director board.

These two institutions specially offer library and information services to the minorities in those areas. NLDSB intends to implement this project in North and East in the near future.

## Conclusion

NL should execute strong leadership to maintain effective library systems throughout the country. However National Library services have not been implemented for the North & East provinces within the period of war situation. As a result of this, the advantages of these significant library projects handled by NL have not received to the people in these areas. At the same time NL was also facing serious difficulties in the process of making national unity through its performances by having some socio-economic constraints at that time. Unlike in the past, new doors are opened to our country through which socio-economic development and the intellectual progress can be rapidly enlarged within the peaceful environment. National Level library network should cover all provinces in the Island by improving knowledge society. Thus National Unity should be developed while preserving multi-lingual documentary heritage not only for the people living today and but also future generation.

**References:**


1. Amarasiri, M S U(ed.) (1990). *National Library of Sri Lanka:Commemorative volume* Colombo: Sri Lanka National Library Services Board

2. Amarasiri Upali. (1992). National Library of Sri Lanka: Completes two years. *Library News.* 13(4) p.22-24.

3. Amarasiri Upali. (1989). The Provincial Council System & the Future Organisation of Librry Services in Sri Lanka. *Library News* 10(1/2) p.8-12

4. De Silva Nalini. (1990). Resources of the National Library of Sri Lanka. *Library News.* 11(3-4) p.18-20.

5. Fernando, Yuresha. (2000) *Religious Minorities.* Colombo : The Human Rights Commission of Sri Lanka.

6. Line, Maurice B.(2001).Changing perspectives on national libraries: a personal view.*Alexandria.* 13(1) p. 43-49

7. National Library and Documentation Centre (2000). *10th Anniversary 1990 -2000 : National Library and Documentation Centre.* Colombo: NLDSB

8. National Library of Thailand (2005). *National Libraries in the Knowledge Based Society: Proceeding.* Bangkok: 6th – 8th July 2005



**DIRECTORY OF LIBRARIES IN SRI LANKA - 2010**

**(Public, University, Research & Technical Libraries)**

**National Library & Documentation Services Board**

**For further details, please contact :**

**Tele : 011 2674386, 011 2685197**

# ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

## පුස්තකාල ලිපි ද්‍රව්‍ය මිල ගණන්

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | දින පත්‍රිකා (සිංහල, දෙමළ) | - | 100 | - රු. | 50.00 |
| 2. | දින පත්‍රිකා (ඉංග්‍රීසි) | - | 100 | - රු. | 60.00 |
| 3. | පොත් තුණ්ඩු (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) | - | 100 | - රු. | 70.00 |
| 4. | පොත් සාක්කු | - | 100 | - රු. | 125.00 |
| 5. | සාමාජික බලපත්‍ර (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) | - | 100 | - රු | 140.00 |
| 6. | සාමාජික අයදුම්පත් (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) | - | 100 | - රු. | 150.00 |
| 7. | සුචි පත්‍රිකා | - | 100 | - රු. | 50.00 |
| 8. | පරිග්‍රහණ ලේඛන (පිටු 600) | - | 01 | - රු. | 1500.00 |
| 9. | පරිග්‍රහණ ලේඛන (පිටු 300) | - | 01 | - රු. | 900.00 |
| 10. | නියමු ලේබල් (පංකට් 01) | | | - රු. | 65.00 |
| 11. | සංවෘත පුස්තිකා පෙට්ටි | - | 01 | - රු. | 265.00 |
| 12. | විවෘත පුස්තිකා පෙට්ටි | - | 01 | - රු. | 200.00 |
| 13. | කාඩ් ට්‍රේ | - | 01 | - රු. | 1,550.00 |

මෙම ද්‍රව්‍ය ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අලෙවිහලෙන් ලබාගත හැකිය.

චෙක්පත් මගින් ගෙවන්නේ නම් අදාළ චෙක්පත, ***"සභාපති, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය"*** නමට ලිවිය යුතු වේ.

**විමසසීම් :** *0112698847, 0112685197*


## යුද්ධයෙන් හානි වූ උතුරු නැගෙනහිර මහජන පුස්තකාල






## උතුරු නැගෙනහිර යළි ඉදිවෙන මහජන පුස්තකාල









ational Library and Documentation Services Board
o. 14, Independence Avenue, Colombo 07.
tp://www.natlib.lk

National Digitization Project

*National Science Foundation*

Institute : National Library and Documentation Services Board

1. Place of Scanning : National Library and Documentation Services Board. Colombo 07
2. Date Scanned : 2017/10/12
3. Name of Digitizing Company : Sanje (Private) Ltd. No 435/16, Kottawa Rd. Hokandara North. Arangala. Hokandara
4. Scanning Officer

Name : N.P.R. Gamage

Signature : ..........

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Library Documentation Officer

Name : Iromi Wijesundara

Signature : ..........

Date : 2017/10/12

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*